**වර්ෂ 2025 ක් වූ අගොස්තු මස 12 වන දින පෙ.ව. 10.00ට ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද**

**<u>මතුගම ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීමේ වාර්තාව</u>**

**සහභාගිත්වය -:ගරු සභිකවරු**

01. කසුන් මුණසිංහ මහතා - ගරු සභාපති
02. අනගිපුර සමන්ත රෝහණ මහතා - ගරු උප සභාපති
03. ලෙව්වන්දුව ලියනගේ මෙරිල් මුණසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
04. තුඩුගලගේ දොන් රෝහිත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
05. අයි.එච්.ඩී. ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
06. අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
07. පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
08. චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
09. සංජේ එරංග කරවිට මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
10. ඩබ්.කේ. සුනෙත් ප්‍රියංකර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
11. ජේ.ඒ. දර්ශන ශ්‍රී සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
12. රසික දුලන්ත වික්‍රමනායක මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
13. විතානගේ දොන් නිශාන්ත මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
14. බී.ඒ. අමිල ගයාන් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
15. පී.ඩී. අමන් ප්‍රසාද් වික්‍රමසිංහ මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
16. වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
17. එම්. ජගත් විමලසිරි මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
18. ලියනගුරුගේ ලාල් රංජිත් සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
19. ඒ. සුජිත් කුමාර මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
20. ගංවාරි සනත් සංජීව මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
21. ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
22. ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
23. මාවතගේ ගාමිණී සිසිර කුලරත්න මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
24. ඩී.ඩබ්. උභයනන්ද පද්මලාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
25. කළුගල හේවාගේ ගාමිණී මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
26. තොටගමගේ නිහාල් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී
27. ටී. විජිතා දර්ශනී කුමාරි ද සිල්වා මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
28. කේ.ඒ.ඩී. තිළිණී මධුෂානි සිරිවර්ධන මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
29. කේ.කේ. කාවින්දයා ඉඳුවරනි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
30. චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
31. ආර්.එම්. රුවන්ති වාසනා රත්නායක මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
32. ඩබ්.ඒ. ඔෂධි ධනංජනා මහත්මිය - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි
33. දොන් සීමන් රාලලාගේ දුමිඳු චතුර සම්පත් මහතා - ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී

**නිලධාරීන්**

01 නෙලු නිශාන්ති ඉද්දගොඩ මහත්මිය - ලේකම්

02 ඩබ්.ඩබ්.ජී.එල්. ප්‍රනාන්දු මහත්මිය - කළමනාකරණ සේවා නිලධාරි (සභා)

ආගම සිහිකිරිම

(අ) පසුගිය සභාවේ රැස්වීම් වාර්තාව සම්මත කිරිම

- 2025.07.29 දිනැති මහ සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරිමට ඉදිරිපත් කරමි. 2025.07.29 වන දින මහ සභා රැස්වීම් වාර්තාව ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණන මහතා විසින් ස්ථිර කිරිමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත කරන ලදී.

(ආ) සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදන

(ආ).1 පළාත් පාලන කොමසාරිස්ගේ අංක LGD/21/සභික පුහුණු/2025 හා 2025.08.05 දිනැති ලිපිය අනුව 2025 වර්ෂයේ පළාත් පාලන මැතිවරණයෙන් තේරී පත් වූ සභිකයින් දැනුවත් කිරිමේ වැඩසටහනක් Garden Beach Hotel, Kaluthara North හි අගෝස්තු මස 19, 20 දෙදින පෙ.ව. 8.30 සිට ප.ව. 5.00 දක්වා පැවැත්වෙන බැවින් ඒ සඳහා සියළුම මන්ත්‍රීවරුන් සහභාගී වන ලෙස දන්වා සිටින අතර සියළුම දෙනා වෙත ප්‍රවාහන පහසුකම් ලබාදිමට කටයුතු කරන බව වැඩිදුරටත් දන්වා සිටිමි.

ආ.2 රීතිය අනුව න්‍යාය පත්‍රය සඳහා යෝජනා ඉදිරිපත් කිරිමේදී වැඩ කරන දින 07කට පෙර යෝජනා ඉදිරිපත් කරන ලද මන්ත්‍රීවරුන් අදාල යෝජනා ලේකම්තුමිය වෙත ලබා දිමට කටයුතු කරන ලෙස දන්වා සිටින අතර එම යෝජනාව මන්ත්‍රීවරයා අත්සන් කර තිබිය යුතුයි.

(ඇ) නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

(ඈ) සංදේශ, පෙත්සම්, පැමිණිලි ඉදිරිපත් කිරිම

(ඉ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -

**ඉ.1 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

1. මතුගම ප්‍රාදේශීය සභාවට අයත් මතුගම මහජන ක්‍රීඩාංගනය අසල ඉදිකර ඇති දෙමහල් වැසිකිලි පද්ධතිය ඉදිකිරීම කුමන නිලධාරියෙකුගේ යෝජනාවක්ද?
   - ❖ **2021 වර්ෂයේ පැවැති මහ සභාවේ අයවැය ලේඛනය අනුව සභාව සතු ක්‍රිඩාංගන සංවර්ධනය කිරිමට රු. 1,000,000.00ක ප්‍රතිපාදන වෙන්කර ඇත.**
   - ❖ **ඒ සඳහා නිලධාරින්ගේ ඉල්ලීමක් නොමැත.**
   - ❖ **2021 වර්ෂයේ පැවැති මහ සභාවේ ඉල්ලීම මත පළාත් සභා ප්‍රතිපාදන යටතේ ව්‍යාපෘතිය ආරම්භ කිරිම සඳහා රු. 5,000,000.00ක මුදලක් ලබා දී ඇත.**
   - ❖ **නැවත 2023.01.09 දින සභාපති මෙරිල් මුණසිංහ මහතාගේ අනුමැතිය යටතේ ඉතිරි වැඩ නිම කිරිමට රු. 3,000,000.00ක ප්‍රතිපාදන ඉල්ලා ඇත. ඒ අනුව පළාත් සභා ප්‍රතිපාදන 2024 යටතේ නැවත රු. 5,000,000.00ක ප්‍රතිපාදන ලබා දී ඇත.**

2. ඒ සඳහා ඇස්තමේන්තුගත මුදල කොපමනද?

**I අදියර රු. 5000,000.00 - 2021**

**II අදියර රු. 5000,000.00 - 2024**

**III අදියර රු. 700,000.00 - 2024**

**IV අදියර රු. 500,000.00 (විදුලිය සඳහා)**

3. ඇස්තමේන්තුව සකස් කරන ලද නිලධාරියා කවුද?

**2021 වර්ෂයේ සිට මතුගම සභාවේ සිටි තාක්ෂණ නිලධාරින්, වැඩ අධිකාරින්**

4. මෙම ව්‍යාපෘතිය සඳහා සභා අරමුදල් කොපමණ ප්‍රමාණයක් යොදවා තිබේද?

**රු. 455,906.90 (විදුලිය)**

5. පළාත් පාලන පාලන අමාත්‍යාංශයෙන් හෝ පළාත් සභා අරමුදල් මෙම ව්‍යාපෘතිය සඳහා ලැබී තිබේද?

**ඔව්**

6. එම මුදල කීයද?

| | | |
|---|---|---|
| I. | **2,814,349.04** | **පළාත් සභා අරමුදල්** |
| II. | **1,982,856.45** | |
| III. | **4,964,689.94** | |
| IV. | **628,160.44** | |
| | **10,390,055.87** | |

7. මෙම ව්‍යාපෘතිය අවසන් කර තිබේද?

**ඔව්**

8. මෙම වැසිකිලි පද්ධතිය පාවිච්චි කිරීමට අවස්ථාව ලැබෙන්නේ කාටද?

**මහජන ක්‍රිඩාංගනය භාවිතා කරන විදුහල් වල දරුවන් හා වෙනත් පුද්ගලිකව ක්‍රිඩාංගනය භාවිතා කරන සියළු දෙනා**

9. මෙම ව්‍යාපෘතිය මගින් මහජනතාවට ලබාදීමට බලාපොරොත්තු වන ප්‍රයෝජනය කුමක්ද?

**ක්‍රීඩා කටයුතු ඉටු කිරිමට උදෑසන සිට රාත්‍රියේ දක්වා පැමිණෙන ක්‍රිඩකයන්ගේ සෞඛ්‍ය ගැටලු විසදිම පාසල් කාලයට පෙර පුහුණුවිම් සඳහා පැමිණෙන දරුවන්හට නැවත පාසලට යාමට අවශ්‍ය සනිපාරක්ෂක පහසුකම් හා ඇඳුම් මාරුකර ගැනිමට අවශ්‍ය පහසුකම් සැකසිම**

10. මතුගම නැබඩ පාර නව වෙළඳ සංකීර්ණය අසලින් මතුගම මහජන ක්‍රීඩාංගනයට පිවිසීමට ඇති මාර්ගයේ ඇතුල්වීමේ දොරටුව විදුලිය මගින් ක්‍රියාත්මක ගේට්ටුවක්ද? නැතහොත් සාමාන්‍ය පරිදි විවෘත කිරීමට හැකි ගේට්ටුවක්ද?

**සාමාන්‍ය පරිදි විවෘත කරන ගේට්ටුවක්**

11. මෙම ව්‍යාපෘතිය කාගේ යෝජනාවක්ද?

**2023 වන විටත් අඩක් නිමකර (කොන්ක්‍රිට් කණු 2 ක් යොදා) තිබූ ස්ථානයක් වන අතර එහි කටයුතු ඉටුකිරිමට 2023 පැවැති මහ සභාවේ අයවැය ලේඛනයටද එම ව්‍යාපෘති ඇතුලත් කර ඇත. ඒ අනුව මුදල් වෙන්කර ගැනිමට කටයුතු කල ව්‍යාපෘතියකි.**

12. ඒ සඳහා වැයකළ මුදල කොපමණද?

**රු. 559,416.01**

13. මෙම ව්‍යාපෘතිය සඳහා යොදවා ඇති මුදල් සභා අරමුදල්ද?

**නැත**

14. මෙම ව්‍යාපෘතිය මගින් ජනතාවට ලැබෙන ප්‍රයෝජනය කුමක්ද?

**ක්‍රිඩාංගනයේ ආරක්ෂාව හා නිති විරෝධි කටයුතු ඉටු කිරිමට වෙනත් පාර්ශව රාත්‍රියේ දී ඇතුල්විම වැළැක්වීම**

15. මෙය කමිටුවක් මගින් අනුමත කර තිබේද?

**ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටු අනුමැතිය මත**

16. මතුගම ප්‍රාදේශීය සභාවට අයත් ශ්‍රවනාගාර භූමියේ ඉදිකර ඇති වාහන අංගනය ඉදිකිරීම සඳහා යෝජනා කරන ලද්දේ කවුරුන් විසින්ද?

**2023 සභා අයවැය ලේඛනයේ අනුමත ව්‍යාපෘතියකි. නමුත් ඉටුකර නැත. 2024 අයවැය ලේඛනයෙන් ද අනුමත ව්‍යාපෘතියකි.**

17. මෙම ඉදිරිකිරීම සඳහා ඇස්තමේන්තු මුදල කොපමනද?

**ලක්ෂ 40**

18. ඇස්තමේන්තුවක් සකස් කර තිබේද/ ඇස්තමේන්තුව සකස් කරන ලද නිලධාරියාගේ නම කුමක්ද?

**ඔව්, සභාවේ වැඩ අධිකාරි හා තාක්ෂණ නිලධාරි**

**ඩී.එම්.එන්.එන්. දසනායක මහත්මිය**

**පී.එච්.යු. පද්මතිලක මහත්මිය**

19. මෙම වාහන අංගනය සඳහා කමිටුවක අනුමැතියක් ලැබී තිබේද?

**ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු අනුමැතිය මත**

20. මෙම ව්‍යාපෘතිය සඳහා පළාත් පාලන පාලන අමාත්‍යාංශයෙන් හෝ පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතියක් ලැබී තිබේද?

**ඔව් - ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය**

21. මෙම ව්‍යාපෘතිය සඳහා සභා අරමුදල් කොපමණ මුදලක් වියදම් කර තිබේද?

**රු. 4,375,000.00**

22. වෙනත් අමාත්‍යාංශයකින් හෝ පළාත් සභා ප්‍රතිපාදන ලැබී තිබේද?

**නැත**

23. මෙම ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා ප්‍රාදේශීය සභාව මගින් සෘජු පදනම මගින් සිදු කළාද?නැතහොත් කොන්ත්‍රාත් සමාගමකට ලබාදී තිබේද?

**කොන්ත්‍රාත් සමිතියක් වෙත ලබා දී ඇත. (ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ප්‍රජා පාදක සමිති තෝරා ගැනිමේ කමිටු නිර්දේශය මත)**

24. යම්කිසි කලෙක ශ්‍රවණාගාරය පුළුල් කිරීමක් සිදුකිරීම සඳහා සිදුවී මෙම වාහන අංගනය කඩා ඉවත් කිරීමට අවශ්‍ය වුවහොත් වාහන අංගනය සඳහා වැයකළ මුදල හා එම පාඩුව දරන්නේ කවුරුන් විසින්ද?

**මෙම වාහන අංගනය නව ශ්‍රවණාගාරයක් සෑදිමේ දී ද භාවිතයට ගත හැකි පරිදි මහල් කිහිපයක් ඉදිකිරිමට හැකි වන පරිදි ශක්තිමත් අත්තිවාරමක් සහිතව ඉදිකර ඇත. තට්ටුව යෙදිමට හැකි වන පරිදි Tie beam ද යොදා ඉදිකිරිම සිදුකර ඇත.**

(ඊ) යථා පරිදි කල් දී ඇති යෝජනා

**ඊ.1 ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.1.1 මතුගම ප්‍රාදේශීය සභාව සතු මහජන පුස්තකාලය මගින් ඵලදායි හා කාර්යක්ෂම මහජන පුස්තකාල සේවාවක් ලබා දිමට උපදේශකත්වය හා මග පෙන්විම සඳහා පුස්තකාල අතුරු ව්‍යවස්ථාව අනුව 2025 වර්ෂයට තෝරාපත් කරගෙන ඇති පුස්තකාල උපදේශක කමිටුව සඳහා ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා සහ ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය ඇතුලත් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

| | | |
|---|---|---|
| පුස්තකාල උපදේශක කමිටුවේ සභාපති | - | කසුන් හිරෝෂණ මුණසිංහ<br>සභාපති,<br>මතුගම ප්‍රාදේශීය සභාව |
| පුස්තකාල උපදේශක කමිටුවේ කැඳවුම්කරු | - | නෙලූ නිශාන්ති ඉද්දගොඩ මිය<br>ලේකම් ,<br>මතුගම ප්‍රාදේශීය සභාව |
| ජයන්තා ලියනගේ මහත්මිය | - | ප්‍රජා සංවර්ධන නිලධාරි,<br>මතුගම ප්‍රාදේශීය සභාව |
| පුස්තකාල උපදේශක කමිටුවේ ලේකම් | - | ඒ.පී.පී. පුෂ්පකුමාරි<br>පුස්තකාලයාධිපති,<br>සී.ඩබ්.ඩබ්.කන්නන්ගර මහජන පුස්තකාලය,<br>මතුගම ප්‍රාදේශීය සභාව |
| පූජ්‍ය යටදොලවත්තේ චන්ද්‍රසිරි හිමි | - | විහාරාධිපති,සුදර්ශනාරාමය , මතුගම |
| පූජ්‍ය ඕවිටිගල සුමේධ හිමි | - | විහාරාධිපති, සුනන්දාරාම පිරිවෙන, ඕවිටිගල |
| ගරු ශිරාන් දසා පියතුමා | - | ශාන්තමේරී දේවස්ථානය ,මතුගම |
| මතුගම සෙනෙවිරුවන් මහතා | - | ලේඛක, ගලබඩයාවත්ත පාර,මතුගම |
| එස්.ආර්.ලියනගේ මහතා | - | විශ්‍රාමලත්,කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ,අංක 15,පළමු |

පටුමග, අඳාගල පාර,මතුගම

| | | |
|---|---|---|
| සෝමරත්න මල්ලිකාරච්චි මහතා | - | විශ්‍රාමලත් විදුහල්පති ,කජුගහවත්ත,නවුත්තුඩුව |
| ප්‍රේමා ජයසිංහ මහත්මිය | - | විශ්‍රාමලත් පාඨශාලාචාර්ය,<br>එක්සත් මාවත,ගල්මත්ත,වලගෙදර |
| දයාසිරි පතිරගේ මහතා | - | ඉද්දගොඩ,මතුගම |
| රන්දුනු ජයලත් මහතා | - | විදුහල්පති, ආනන්ද ශාස්ත්‍රාලය,මතුගම |
| බී.ඒ.ධර්මසේන මහතා | - | විශ්‍රාමලත් පාඨශාලාචාර්ය,<br>දර්ශන,ඇල්හේන,යටදොලවත්ත,මතුගම |
| නිහාල් ජයනෙත්ති මහතා | - | හදිසි මරණ පරීක්ෂක,කොරමිල්ලවත්ත,වැලිපැන්න |
| ටී.ආරියසේන ප්‍රනාන්දු මහතා | - | විශ්‍රාමලත් පාඨශාලාචාර්ය,"සමරුව ",මීගම,දර්ගා නගරය |
| ගාමිණී මුණසිංහ මහතා | - | ව්‍යාපාරික / සමාජ සේවක,ආඳාගල පාර,5 වන පටුමග,මතුගම |
| ඩබ්.විමලසේන මහතා | - | විශ්‍රාමලත් තැපැල් නිලධාරි,හේනේගම,මතුගම |

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.1.1 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ.1.2** පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන - 2025 යටතේ අනුමත ව්‍යාපෘති අංක S256141249019 දරණ මතුගම ප්‍රාදේශීය සභාවට අයත් ප්‍රධාන කාර්යාලයේ විදුලි රැහැන් කණු විතැන් කිරිම ව්‍යාපෘතිය සඳහා අනුමත මුදල රු. 1,200,000.00කි. ඒ සඳහා ලංකා විදුලි බල මණ්ඩලය වෙතින් ලබා දී ඇති ඇස්තමේන්තුව රු. 1118857.52කි. එම මුදල් සභා අරමුදලින් පෙර ගෙවා පළාත් සභාව වෙතින් ප්‍රතිපූර්ණය කර ගැනිමට අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාල භූමියේ මෙතෙක් තිබූ විදුලි රැහැන් පද්ධතිය හදිස්සියේ ඉවත් කිරිමට හේතුව පැහැදිලි කරන මෙන් ගරු සභාපතිතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම කාර්යාලය ඉදිරිපිට තිබෙන විදුලි රැහැන් පද්ධතිය තමයි ඉවත් කරන ලෙස ඉල්ලා සිටින්නේ. දරුවන් නිතර ගැවසෙන ස්ථානයක් වගේම දරුවන් වෙනුවෙන් පොත් පත් තබා ගැනිමට මෙම ස්ථානයේ හට් දෙකක් ගැසිමට ඉදිරියේ දී බලාපොරොත්තු වෙනවා ඒ නිසා මෙම අනාරක්ෂිත ස්ථානයෙන් ආරක්ෂිත ස්ථානයකට ගෙන යාමට කටයුතු කරන ලෙස තමයි ඉල්ලා සිටින්නේ. මෙම ව්‍යාපෘතිය පළාත් සභා ව්‍යාපෘතියක් බැවින් එම මුදල් ප්‍රතිපූර් ණය සිදු වෙනවා.

**තීරණය - ඊ.1.2 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.3 පළාත් නඩත්තු ක්‍රියාකාරි සැලැස්ම (පළාත් සහා ප්‍රදාන) - 2025 යටතේ අනුමත ව්‍යාපෘති අංක M259183141001 දරණ මතුගම ප්‍රාදේශීය සභා ශ්‍රවණාගාරයේ පැරණි ලී දොරවල් ඉවත් කර, නව ඇලුමිනියම් දොරවල් සකස් කිරිම, වැසිකිලි හා විවේක කාමර දොර ජනේල අළුත්වැඩියා කිරිම සහ වහලයේ රාමුව වර්ණ ගැන්විම ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද රු. 2,000,000.00 වන ඇස්තමේන්තුව අනුමැතියට සහ එම ව්‍යාපෘතිය ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ කමිටු අනුමැතිය සහිතව ඉල්ලුම් කර ඇත ඇතුලත්මුදලිගම ''සත්ජය'' සුබසාධක සමිතිය වෙත පිරිනැමිමටත් අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ගරු සභාපතිතුමා මතුගම ශ්‍රවණාගාරයේ වහලයේ රාමුව, දොර ජනේල අළුත්වැඩියා කිරිම සම්බන්ධව අපගේ විරුද්ධත්වයක් නැහැ. ඒ වගේම සත්ජය සුබ සාධක සමිතිය වෙත පිරිනැමිම සම්බන්ධව අපගේ විරුද්ධත්වයක් නැහැ නමුත් මේ සඳහා සකස් කරන ලද ඇස්තමේන්තුව සභාවට ඉදිරිපත් කරනවා නම් වඩාත් හොඳයි.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සියළු දෙනාටම එම ඇස්තමේන්තුව ලැබෙන්න සලස්වන්න පුළුවන්.

**තීරණය - ඊ.1.3යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ.1.4** පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන -2025 යටතේ අනුමත ව්‍යාපෘති අංක S256133149004 අංක දරණ මතුගම ප්‍රාදේශිය සභාවේ කොම්පෝස්ට් අංගනයේ බිම කොන්ක්‍රිට් කර ඇති ස්ථානයේ අලුතින් කොන්ක්‍රිට් කණු ඉදිකර ඇස්බැස්ටස් තහඩු යොදා වහලය ඉදිකිරිම ව්‍යාපෘතිය සඳහා සකස් කරන ලද රු. 8,000,000.00 වන ඇස්තමේන්තුව අනුමැතියට සහ ව්‍යාපෘතිය ඉටු කිරිම සඳහා සභාවේ ලියාපදිංචි කොන්ත්‍රාත්කරුවන් වෙතින් ලංසු කැඳවිමට අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්රී චමිලාන් රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මෙම කොම්පෝසට් අංගනයේ ප්‍රායෝගික ගැටළුවක් තියෙනවා 1.4 හා 1.10 යටතේ කොම්පෝස්ට් අංගනයේ වහලය අළුත්වැඩියා කිරිම හා කොම්පෝස්ට් අංගනය වටා තාප්පයක් බැදිම යන කාරණා දෙකක් තියෙනවා මම හිතනවා මෙකේ තියෙන ගැටළුව තමයි කොම්පෝස්ට් එකතු වන ප්‍රමාණය ඉහල ගිහින් තියෙනවා. වහලය ගැසිම හා බිම කොන්ක්‍රිට් කිරිම සම්බන්ධව

ගැටළුවක් නැහැ තාප්පය බැඳිමෙන් සිදුවෙන්නේ එය උඩට තවත් එකතු වන එක මිසක එයින් සිදුවන වාසියක් නැහැ. එම නිසා එකතු වන කොම්පෝස්ට් ටික හලලා කළමනාකරණය කිරිම මිසක් මම හිතනවා තාප්පය බැඳිම ප්‍රායෝගික නැහැ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මන්ත්‍රීතුමා දැනට තියෙන කොම්පෝස්ට් බාලා තියෙන තැනට නෙමෙයි එතනට ඉහල කැල්ලට තමයි වහල ගහන්නේ. ඒ කියන්නේ බේල් කරන තැනට තමයි වහල ගහන්නේ. වහල ගහන්න අපිට දැනට පළාත් පාලනයෙන් මුදල් ලැබිලා තියෙනවා. වහල ගැසිමෙනන් පසුව දිරන කසල බාන්නේ උඩ කැල්ලේ ඊට පස්සේ අපිට පුළුවන් ගලි හරහා ඒ ලබා එන ජලය රඳවා ගන්න. දැන් තියෙන විදිහට කඩිත්තමංකඩ ඇළට තමයි සියල්ල එකතු වෙන්නේ. එය ඉතා අවලස්සනයි. ඉන් අනතුරුව එම ස්ථානය යොදා ගන්නවා නොදිරන කසල වෙන් කිරිමට හා බේල් කිරිමටයි. එම නිසා තමයි ප්‍රධාන පාරට මුණත ටික වහල මටට්ටමට උස්සන්න හදනන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

කඩිත්තමංකඩ ඇලට අපද්‍රව්‍ය එකතු වන එක නැවැත්විම සඳහා මම හිතනවා පිල්ටර් ක්‍රමයක් වලවල් තුනක් හදලා තාක්ෂණ නිලධාරින් දන්නවා එහෙම ක්‍රමයක් මිසක් කාණු පද්ධතියක් හැදුවත් එම කාණු පද්ධතියත් කඩිත්තමංකඩ ඇළට තමයි මුදා හරින්න වෙන්නේ. එම මුදා හරිද්දි ඒ කාණු පද්ධතිය හැදිම සම්බන්ධයෙන් ප්‍රශ්නයක් නැහැ. ඒ වහල හදලා උඩින් වැටෙන වතුර අර කුණු වලට වැටිලා සේදිලා යන එකත් නතර කරන්නත් පුළුවන්. වටේ ගහලා තියෙනවා තාප්පයක් ඒ තාප්පයම නැවත උස්සන්නද සැලසුමක් ද මේ තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

දැනට කාණුව හරහා දාලා තියෙනවා බැම්මක් ඒ බැම්ම තමයි දැන් උස්සන් හදන්නේ උඩට ඉස්සරහා ටික. දැනට මෙහි ගලි ලයින් තුනක් තියෙනවා. එබැවින් අපි දැන් දිරන කසල ටික උඩට බාන්න තමයි හදන්නේ එතකොට අපිට පුළුවන් එහි ඇති වතුර ටික පුළුවන් ගලි ලයින් ටිකට ගන්න ලේසියි.

**තීරණය - ඊ.1.4 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ.1.5** මතුගම නගර සිමාව ඇති මාර්ග අළුත්වැඩියා කටයුතු හා හඳුනාගත් ස්ථාන ඇස්තමේන්තු කර පිළිසකර කිරිමට අනුමැතිය සඳහා ගරු සභාවට යෝජනා කරමි.

**නඩත්තු කිරිම්**

i. පැස්කුවල් මාවත
ii. වික්‍රම මාවත
iii. බිලිංගහකන්ද පාර
iv. ආදාගල අදිකාරම් විද්‍යාල පිටුපස මාර්ගය
v. සුදර්ශන මාවත
vi. බාලිකා පාර සිට පැස්කුවල් මාවත දක්වා මාර්ගය
vii. රිදිවිටවත්ත පාර

viii. ඩිපෝ පාර අතුරු පාර
ix. ඇතුලත්මුදලිගම පන්සල පාර
x. කිකිළහැඩුවත්ත පාර
xi. කොරටුහේන පාර
xii. ආනන්ද පාසල පාර
xiii. අරාව පාර
xiv. කොම්පෝස්ට් අංගනය දක්වා මාර්ගය
xv. වැත්තෑව රෝහල පාර
xvi. සිරිකඳුර වත්ත පාර
xvii. ගල්මත්ත පොල භූමිය තාර දැමීම

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සභා යෝජනා සඳහා ඉදිරිපත් කරන පාරවල් සම්බන්ධව අපි එකගයි. සභාපතිතුමා මම දන්න විදිහට ආනන්ද ඉස්කෝලේ අසලින් නැබඩ පාරට වැටෙන පාර **PRD** පාරක්ද සභාව සතු පාරක්ද කියලා මම දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

ආනන්ද පාසලේ මායිමේ ඇති කොට්ටම්බා ගස අසලින් නැබඩ පාරට වැටෙන **L** හැඩයේ මාර්ගය නැබඩ පාරේ පොම්ප කඩය අසලට වැටෙන පාර. මේ එහා පැත්තේ ඇති පාර විජේගුණවර්ධන මාවත අනෙක් එක ආනන්ද මාවත ඒවා සභාව සතු පාරවල්. මේ කියන පාර අළුත් පාරක් අතුරු මාර්ග පිළිසකර කිරිම යටතේ කළයුතු මාර්ගයක්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

වැස්ස කාලයට නැබඩ පාර පන්සල අසල අඩි 1 ½ක් පමණ ජලයෙන් යටවෙනවා ඒ අවස්ථාවන් වලදී මේ අතුරු මාර්ගය තමයි ලමුන් භාවිතා කරන්නේ ගමන් කිරිමට. මේ අවස්ථාවේ මම සතුටු වෙනවා මෙම මාර්ගය පිළිසකර කිරිම සම්බන්ධව.

**තීරණය - ඊ.1.5 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.1.6 ආනන්ද පාර අතුරු මාර්ගය සංවර්ධනය කළයුතු මාර්ගයක් බැවින් සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඊ.1.6 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.1.7 ගලබඩයාවත්ත පාර කාණු පද්ධතිය සැකසිම කළයුතු බැවින් ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා උප සභාපති ඒ. සමන්ත රෝහණ මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඊ.1.7 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.1.8 පුස්තකාලය ඉදිරිපිට 10'X8' ප්‍රමාණයේ සමර් හට් දෙකක් (මේ වන විට ඇස්තමේන්තු අනුමත කර ඇත.) ඉදිකිරීමට ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඊ.1.8 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.9 මතුගම ළමා උද්‍යානයේ ශ්‍රවණාගාරය මායිම සිට වැහි ආවරණයක් යෙදීමට (අඩි 50X8 ප්‍රමාණය) ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මතුගම ශ්‍රවණාගාරය අසල ඇති ළමා උද්‍යානය අසල තමයි මේ ඉදිරිකරීම සිදුකරන්නේ. එතන මේ වන විට එතන තිබෙන්නේ එක කොට්ටම්බා ගසක් විතරයි. දැන් ඒක දිරලා තිබෙන බැවින් ඉවත් කිරීමට සිදුවෙනවා. එම ස්ථානයේ සෙවණ ලැබෙන්න කිසිම ගසක් නොමැති බැවින් එම ස්ථානයේ වැහි ආවරණයක් එකක් ඉදිකිරීමට තමයි යෝජනා කරන්නේ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

පසුගිය දිනවල එම ස්ථානයේ සෙල්ලම් උපකරණයක් කැඩී තිබූ බැවින් එහි දැන් තත්ත්වය පොඩ්ඩක් පැහැදිලි කරන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ වන විට අපේ තාක්ෂණ නිලධාරින් හරහා එම කාර්යය යථා තත්ත්වයට පත්කර ඇති බව දන්වා සිටිනවා

**තීරණය - ඊ.1.9 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.10 කොම්පෝස්ට් අංගනයේ වහලවල් අළුත්වැඩියාව, අංගනය වටා තාප්පය බැදීම, කාණු පද්ධතිය සැකසීම වැනි හඳුනාගත් අළුත්වැඩියා කටයුතු සිදු කිරීමට අවශ්‍ය සභා අනුමැතිය ලබා ගැනීමට ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය**

පැත්තකට දාලා තියෙන මැෂින එක් අපිට බැරිද ක්‍රියාත්මක කරගන්න කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ වන විට ඒ සියල්ල සුදානම් කරමින් සිටින්නේ මැෂින් එකත් කැඩිලා, බෙල්ට් එකත් කැඩිලා තියෙන්නේ අපේ තාක්ෂණ නිලධාරින් හදන්නේ ඉක්මණින් බෙල්ට් එක නැතුව මැෂින් එක දුවන තත්ත්වයට ගේන්න තමයි යෝජනා කලේ. මේ වන විට ප්‍රතිසංස්කරණය කරමින් ඉන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

ගරු සභාපතිතුමනි, ඇතුලත්මුදලිගමට යන මාර්ගයේ හතරමං හන්දියක් තියෙනවා එම ස්ථානයේ සැහෙන්න ප්‍රමාණයක් අනතුරු සිද්දවෙලා තියෙනවා එම නිසා මම යෝජනා කරනවා RDA එකත් එක්ක සාකච්ඡා කරලා බැම්මක් බැදලා වාහන ශ්ලෝ කරලා යන ස්ථානයක් බවට පත්කරන්න.

**තීරණය - ඊ.1.10 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.11 ගල්මත්ත උප කාර්යාලය සඳහා ෆොටෝ කොපි යන්ත්‍රයක් මිලදී ගැනිමට ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**තීරණය - ඊ.1.11 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.12 කොස්වත්තගොඩ මාර්ගය ප්‍රදේශවාසින්ගේ මාර්ග අවශ්‍යතා සඳහා නිදහස් කර ගැනිම හා සතිපොල සඳහා ඉදිකර ඇති ගොඩනැගිල්ල තිබියදිත් මාර්ගය දෙපස ඉදිකර ඇති අනවසර මාළු වෙළඳසැල් හා කඩ කාමර ඉවත් කර නොගැනිම සම්බන්ධව ඉදිරිපත් කරනු ලබන ප්‍රදේශවාසින්ගේ ඉල්ලිම නිතිඥ ඒ.කේ. තිළිණි නිසංසලා මිය විසින් සභාව වෙත ඉදිරිපත් කර ඇත. එම ඉල්ලීමේ ලිපියේ කරුණු ගරු සභාවට යෝජනා කරමි. **(ඇමුණුම 01)**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම යෝජනාව ලිපි විදිහට ඉදිරිපත් කළයුතු වුවත් යෝජනාවක් විදිහට ඉදිරිපත් කිරිම පිළිබඳව මම කිසිසේත් පිළිගන්නේ නැහැ. එම නිසා මෙම යෝජනා සංශෝධනය කරලා සංශෝධන යෝජනාවක් ලෙස නැවත ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම යෝජනාව සම්බන්ධයෙන් කලින් සිටම එන ප්‍රශ්නයක් ඔබතුමාලාගේ දැන ගැනිම සඳහා තමයි ඉදිරිපත් කලේ. මේ සම්බන්ධයෙන් උත්තරයක් අපි හොයාගෙන තියෙන්නේ මොකද මේක මෙතනින් වෙනතැනකට යා යුතුයි කියන තැන අපි ඉන්නවා. මේ සම්බන්ධයෙන් කුමක් කරනවාද කොතනටද මෙය ගෙන යන්නේ කියලා ඉදිරි සභා වාරයකදී සභාව දැනුවත් කිරිමට මම බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධව සියළු දෙනා දැනුවත් කිරිම සඳහා තමයි මෙය ඉදිරිපත් කලේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ඔබතුමා ඊළඟ සභා වාරයකදි පැහැදිලි නිශ්චිත නිගමනයක් සහිතව සභාවට යෝජනාවක් ඉදිරිපත් කිරිම සම්බන්ධව අපි එකඟයි. ඒ වගේම ඔබතුමාගේ අවධානය යොමුකරනවා දැනට අපි

දැන්ගන්න ලැබෙන තොරතුරු මේ මාළු කඩ මතුගම ප්‍රදේශයේ නගර සීමාව ඇතුලත ස්ථිර මාළු වෙළඳ ව්‍යාපාර වලට අමතරව, තවත් මාළු කඩ රාශියක් මේ නගර සීමාව ඇතුලත තැනින් තැන මාළු වෙළඳ පවත්වාගෙන යාම නිසා ඔබතුමා බලාපොරොත්තු වන ලස්සන මතුගමක් ගොඩනගන්න යන කාරණයේ දී ලොකු අභියෝග රැසක් මතුවෙන්න පුළුවන් එම නිසා ඔබතුමාගේ අවධානය යොමුකරනවා මම දන්නේ නැහැ ඔබතුමා දැනුවත්ද කියන එක මේ නගරය මුළුමනින්ම මේ නගරය පුරාම විවිධ වෙළඳ සැල් බිහි වුනා එම නිසා අවිධිමත් නගරයක් බිහිවීමට ඉඩ දෙන්න එපා. මේ සම්බන්ධව ඉදිරි සභා වාරයකදී කරුණු ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ යෝජනාවේදී ගැටළුව තියෙන්නේ මාළු කඩ සම්බන්ධව විතරක් නෙමෙයි. සියළුම පාරවල් වල අනවසර ඉදිරිකිරිම් තියෙනවා. මාළු කඩයක් දානවා කියන්නේ ඒක ඉවත් කිරිමට සභාවට බලයක් නැහැ.පරිසර වාර්තාවක් ලබාගෙන තියෙනවා නම්, වෙළඳ බලපත්‍රයක් ලබා දිමට අපි බැදිලා තියෙනවා. අපි මේ වන විට අනවසර ඉදිරි කිරිම් සම්බන්ධය **RDA**, **PRD**, පොලිසිය දැනුවත් කරලා තියෙන්නේ. මේ අනවසර ඉදිකිරිම් කියන කාරණාවා දැඩිලෙස මේ වන විට සාකච්ඡා කරමින් සිටින්නේ. ඉදිරියේ දී ගතයුතු ක්‍රියාමාර්ග හැකි ඉක්මණින් ලබා ගන්නා බව කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

පරිසර බලපත්‍රයක් ලබා ගෙන නගරයේ ඕනෑම තැනක ව්‍යාපාරයක් කරගෙන යන්න පුළුවන්ද වෙළඳ බලපත්‍රයක් ලබාදෙනවද කියලා දැනගන්න පුළුවන්ද. ඇත්ත ඔබතුමා කියන විදිහට මේ සියල්ල ක්‍රමාණුකූලව තමයි ඉවත් කළයුතු වන්නේ. මේ මාළු ලැල්ල සම්බන්ධව නිශ්චිත නිගමනයකට එන්න ඕන ඇවිල්ලා යෝජනාවක් ගෙනැල්ලා ක්‍රියාත්මක වෙන්න ඕන.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දර්ශන ශ්‍රී සම්පත් මහතා**

ප්‍රයිවට් බස් ස්ටැන්ඩ් එකේ තියෙන එළවළු අනවසර ලැල්ල සම්බන්ධයෙන් මගේ අදහසක් තියෙනවා ඒ අය සභාවට කුලියක් ගෙවන්නේ නැහැ මම දන්න විදිහට

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

අධිකරණයේ තියෙන නඩු කටයුත්තක් නිසා මේ සම්බන්ධයෙන් මට අදහසක් දක්වන්න බැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දර්ශන ශ්‍රී සම්පත් මහතා**

ඒ අය කියන්නේ ඒ අයට නීත්‍යානුකූල අයිතියක් තියෙනවා කියලා. මේ සම්බන්ධයෙන් ඔබතුමා මැදිහත් වෙලා ක්‍රියාමාර්ගයක් ගත්තානම් හොදයි කියලා මම හිතන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සභාවට අයිති ඉඩමක් නෙමෙයි එම ඉඩම අපිට තීන්දු තිරණ ගන්නා බැහැ. නමුත් මේක උසාවියේ තියෙන නඩු කටයුත්තක් බැවින් අපිට තින්දු තීරණ ගන්න බැහැ. දැන් උසාවියෙන් තීන්දුවක් දීලා

තියෙන්නේ නීත්‍යානුකූලව එම අයට තියෙන අයිතිය පෙන්නන්න කියලා. ඔහුට එය තවම පෙන්නා දෙන්න පුළුවන්කමක් ලැබිලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

අධිකරණයේ නඩුව තියෙන්නේ මහජන පිඩාවක් සම්බන්ධවයි. අනවසර ඉදිකිරිම් ඉවත් කිරිමට ඔබතුමාට බලය තියෙනවා. ඔබතුමා මතුගම පුංචි ජනාධිපතිතුමා. මේ සම්බන්ධයෙන් නිතිපතිතුමාගෙන් උපදෙස් ඉල්ලා සිටින ලෙස ඔබතුමාට යෝජනා කරවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

සභාපතිතුමනි ඔබතුමන්ට අනවසර ඉදිකිරිමක් සිදුවෙනවා නම් එය නවත්වන්න බලය තියෙනවා රටේ පවතින ආර්ථික බලපෑම් මත අපි මේ සම්බන්ධයෙන් තිරනයක් ගන්න. ඒ වගේම බිල්ඩින් අනුමැතියට දැමු පසු එහි අඩු පාඩු ඉක්මණින් දැනුම් දීලා ඒ ජනතාවට පහසුකම් ලබාදියයුතුයි මම කියා සිටිනවා. අනවසර ඉදිකිරිම සම්බන්ධයෙන් විශේෂයෙන් වැඩ පිළිවෙලක් දාලා මින් ඉදිරියට කරගෙන යන්න කියලා මම කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

අනවසර ඉදිකිරිමක් කරලා මොනවා හරි ව්‍යාපාරයක් කරලා කියක් හරි හොයාගෙන ජිවත්වන සහෝදරයෝ තමයි මේ ඉන්නේ. මගේ අදහස තමයි වෙළෙන්දන් වර්ගීකරණය කරලා සියළුම වෙළඳුන් ස්ථානගත කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මතුගම අධිකරණය ඉදිරිපිට ඇති කැප්ටන් විතාන මාවතේ පිහිටා ඇති ඇළ මාර්ගය හරස් කරලා බෝක්කුවක් හඳනවා. එතන ඉදලා බලන කොට පේනවා ඇළ මාර්ගය හරස් කරලා ස්ලැබ් එකක් දානවා ඒ ස්ලැබ් එක දාන්න කොන්ක්‍රිට් කණු ඇළ මාර්ගය වහලා තමයි දාන්නේ තාම සතියකට වඩා නැහැ. ඔබතුමාගෙන් දුරකථනයෙන් විමසු පසු පැවසුවේ මේ වන විට තහනම් කර ඇති බවයි. එසේ කර ඇත්නම් අපිට පුළුවන් අධිකරණය මාර්ගයෙන් ඉවත් කිරිමට නියෝගයක් ලබාගන්න. එම අනවසර ඉදිකිරිම හේතුවෙන් වර්ෂාවක් ආවොත් බෝක්කුව හිර විම නිසා එම කැප්ටන් විතාන මාවත ජලයෙන් යට විමට ඉඩකඩ වැඩියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

ඩී.ඒ. මුණසිංහ මාවත කියලා තමයි දැන් මේ මාර්ගය හඳුන්වනනේ . මේ ප්‍රදේශයේ ජනතාව වරිපනම් ගෙවන ජනතාව. මේ සම්බන්ධයෙන් යෝජනාව සංශෝධනය කර හෝ මේ නඩුව සම්බන්ධයෙන් තීරණයක් ගමු.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ වෙළෙන්දන් කැමති නැහැ මෙතනින් යන්න මේ අයට ගලි ලයින් ගහලා පොලේ ස්ථානයක් හඳලා දිලා තියෙන්නේ. මේ නඩු කටයුත්ත යන්නේ පාර අවහිර නොවන පරිදි පාර ලබාදෙන්න

කියලා. නඩු කටයුත්තකට නොගිහින් මේ වෙළඳුන් සමග සාකච්ඡා කොට කඩෙන් එළියට ඇති කොටස ඉවත් කරලා දැනට මෙය පවත්වාගෙන යන්න අවස්ථාව දෙන්න තමයි අපි අදහස් කරලා තියෙන්නේ. දැන් සාකච්ඡා මාර්ගයේ තියෙන්නේ. ඉදිරි කාල සීමාව තුළ අපි නිවැරදි තැනට ගෙනිහිල්ලා වෙළඳුන්ට අවශ්‍ය කරන කාරණා ඉෂ්ඨ කරලා නඩු කටයුත්තකට නොගිහින් විසඳගන්න තැනට තමයි බලාපොරොත්තු වෙන්නේ.

මින් ඉදිරියට මතුගම නගර සීමාව තුල අනවසර වෙළඳුන් ඉවත් කරලා තියෙනවා ඉදිරියට අළුතින් වෙළඳුන්ට එන්න දෙන්නේ නැහැ. දැන් ඉන්න අයටත් ඉවත් වෙන්න කියලා ලිඛිව දැනුවත් කරලා තියෙන්නේ.

**තීරණය -** ඊ.1.12 **යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.1.13. MR5096 දරණ සිප්ලි අධ්‍යාපන ආයතනයේ තාප්පය කඩා වැටීම සම්බන්ධයෙන් 3 වන විත්තිකරු ලෙස සභාව ඉදිරිපත් කර ඇත. ඒ සඳහා ගරු අධිකරණයේ පෙනී සිටීමට නිතිඥ රූපසිරි ප්‍රනාන්දු මහතා පෙනී සිටින බව ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී.ඒ. අමිල ගයාන් මහතා**

මෙම සිදුවීම සිදුවන අවස්ථාවේ මම එම ස්ථානයේ හිටියා. මෙතන සිදුවුයේ තාප්පයක් කඩාවැටීමක් නෙමෙයි, බ්ලොග් ගල් හතරක පමණ නාමපුවරුවක් තමයි කඩා වැටුනේ. මේ වෙලාවේ සභාව විත්තිකරු විදිහට පෙනී සිටීමට සිදුව ඇති බැවින් එය තාප්පයක් නොව නාමපුවරුවක් ලෙස සංශෝධනය විය යුතු බව මම ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් අපට පොඩ්ඩක් පැහැදිලි කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම මියගිය දරුවාගේ පාර්ශවයෙන් තමයි අපිව තුන්වන විත්තිකරු කරලා තියෙන්නේ. මන්ත්‍රීවරයෙකු ලෙස මම සිටින කාලේ මම එම ආයතනයට ගිහින් බලලා තියෙනවා මෙය විධිමත් ආකාරයට හදලා නෙමෙයි තියෙන්නේ. ඉදිරියේදී මේ ආයතනය සම්බධයෙන් නීතිය ක්‍රියාත්මක කරන්න බලාපොරෝත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

මෙවැනි අනතුරු නොවන්න කටයුතු කළ යුතුයි. මේ ආයතනය සම්බන්ධයෙන් සම්පූර්ණ වාර්තාවක් ලබාගන්නා ලෙස මම ප්‍රකාශ කර සිටිනවා. අපට එම දරුවා වෙනුවෙන් කතා කරන්න අවස්ථාවක් ලැබුනේ නැහැ මහජන නියෝජිතයින් හැටියට . අප සියළුදෙනාගේ සංවේගය මේ අවස්ථාවේ ප්‍රකාශ කර සිටිනවා පවුලේ අය වෙත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

ප්‍රථමයෙන්ම ශෝකය ප්‍රකාශ කර සිටිනවා. තාප්පය නොවෙයි නාම පුවරුව තමයි කඩා වැටුනේ. ටියුෂන් ආයතන හදන විට ඒ සම්බන්ධයෙන් සුදුසු ද යන්න සොයා බලා අවසර ලබාදෙන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

පස්දුන් කෝරලේ ඉතිහාසයේ මම හිතන විදිහට පෞද්ගලික පන්ති වැඩිපුරම තියෙන්නේ මතුගම. පාසල් ප්‍රමාණයට වඩා දහගුණයක් වැඩියෙන් පෞද්ගලික පන්ති තියෙනවා. පෞද්ගලික පන්ති වල ගුරුවරු සියළු දෙනා සමඟ සාකච්ඡා කරලා යම්කිසි වැඩපිළිවෙලක් සංවිධානය කර මෙවන් දේවල් නොවන්න වගබලා ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

ලස්සන මතුගම කියන වැඩපිලිවෙල සමඟ දිවා රාත්‍රී සේවය මගින් කුණු කසළ ඉවත් කිරිම සිදුකරනවා. මේ සම්බන්ධයෙන් ඔබතුමන්ට ස්තූතිවන්ත වෙනවා.

**තීරණය - ඊ.1.13. යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.14 වැල්කන්දල කැටේලන්ද පොදු සුසාන භූමිය අනවසරයෙන් පදිංචිකරුවන් විසින් භුක්ති විදින බැවින් මැනුම් කටයුතු කර නැවත සභාවේ භුක්තියට නතුකර ගැනිම සුදුසු බව ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්. ආර්. දුමිදු චතුර සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්. ආර්. දුමිදු චතුර සම්පත් මහතා**

මෙම ස්ථානයේ සිටින පුද්ගලයින් ස්ථිර බෝග වගේම තාවකාලික බෝග වවලා තියෙනවා මොවුන්ට අපේ පැත්තෙන් ලබා දියහැකි සහනය මොකක්ද කියලා දැනගන්න පුළුවන්ද.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙන බොහෝ සොහොන් භූමි ජනතාව විසින් අල්ලාගෙන තියෙනවා. පොදුවේ සියළුම සොහොන් භූමි ශුද්ධකරලා, මැනුම් කරලා, මායිම් නිරවුල් කරලා මේවායේ තියෙන අනවසර ඉවත් කරන්න, මේවායේ තියෙන අවභාවිතාව ඉවත් කරන්න කටයුතු කරන්න ඕන කියන එක තමයි මගේ අදහස.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය**

ආදාවල කට්ටඩිහේන සුසාන භූමියේ පොළව කබොක් පස අවට සිටින පිරිස විසින් එම සුසාන භූමිය අල්ලාගෙන සිටින්නේ වලක් කපන්නත් ඉඩකඩ නැහැ. මීට පෙර සිටි ලේකම්වරියගේ කාලේ මැනුම් කිරිමට දාලා තිබුණත් එය ඉටු වුයේ නැහැ. මේ සම්බන්ධයෙන් ප්‍රමුඛත්වය ගන්න ඕන කියලා මම හිතනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා**

මෙම සුසාන භූමිය ප්‍රාදේශීය සභාව සතුනම් එය ඔබතුමාගේ බලය භාවිතා කර සභාව සතු කර ගන්නා ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

2018 වර්ෂයේ මා මන්ත්‍රීවරියක් ලෙස පත් වු විට මාගේ පළමු යෝජනාව. අවාසනාවකට එය ක්‍රියාත්මක වුයේ නැහැ. මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ගරු සභාවෙන් සුසාන භූමි තුළ වලවල් ස්ථිරව බඳින්න අවසර දෙන්න එපා. අවසර දිපු තැනක් නැහැ. මං දන්න විදිහට සභාවෙන් අවසර ගන්න ඕන. නමුත් කිසි කෙනෙක් අවසර ගන්නේ නැහැ කොන්ක්‍රීට් බැම්මවල් වලින් සොහොන් ගෙවල් හදනවා. කැටගොඩ සුසාන භූමියේ පර්. 10කට අඩු ප්‍රමාණයක් තමයි තියෙන්නේ. තඹරුටිය ග්‍රාම නිලධාරි වසමෙත් ඉඩ ඉතුරු වෙලා නැහැ. උසාවි නියෝගයකින් හරි සොහොන් ගෙවල් ඉවත් කරලා තියෙන ප්‍රමාණය හරි නිරවුල් කර දෙන්න ප්‍රදේශවාසීන්ට. මේ සියළුම සුසාන භූමි නිරවුල් කරලා ඒ සුසාන භූමි වලට ආරක්ෂිත වැටවල් දාලා එහි අයිතිය ගන්න ප්‍රාදේශීය සභාවට. අයිතිය අරගෙන සොහොන් ගෙවල් බඳින විට අනිවාර්යයෙන් සභා අවසරයක් ගන්න කටයුතු කරන්න කියලා ඉල්ලිම කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමිල ගයාන් මහතා**

වැත්තැව සුසාන භූමිය තවත් එහාට ඇති බැවින් මේ සම්බන්ධයෙන් සොයා බලා එම භූමිය නිරවුල් කර ගන්නා මෙන් දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මගේ වසමේ තියෙනවා සුසාන භූමි 03ක් තියෙනවා. පුද්ගලයන්ගේ බලපෑම් සහගතව තිබෙන සුසාන භූමි ටික හඳුනාගෙන ඒවාට ප්‍රමුඛතාවය දිලා ඒවා මුලින් මැනුම් කටයුතු කරන්න ඒ සඳහා මේ සභාවේ යෝජනාවක් ගෙනැල්ලා සම්මත කරගන්නා ලෙස මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සොහොන් භූමි පනත අනුව ප්‍රාදේශීය සභාව සතු භූමියක මිනිය තැන්පත් කර සොහොන් කොතක් හැදුවොත් අවුරුද්දකට සැරයක් මුදලක් සභාවට ගෙවන්න ඕන. මෙතන කවුරුවත් වාර්ෂිකව මුදලක් සභාවට ගෙවන්නේ නැහැ. මම ගරු සභාවට යෝජනා කරනවා මතුගම බල ප්‍රදේශයේ තියෙන ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ තියෙන සියළුම සුසාන භූමි වල බෝඩ් එකක් සකස් කරන්න සභාවේ අවසරයකින් තොරව කිසිදු සොහොන් කොතක් ඉදිකිරිම හා වල දැම්ම නොකළයුතු බව.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණි මහතා**

ගමේ මලගෙදරට ග්‍රාම නිලධාරිවරයා සහභාගි වන බැවින් ප්‍රාදේශීය ලේකම්තුමා හරහා සියළුම ග්‍රාම නිලධාරින් දැනුවත් කරන්න කියන්න මේ සොහොන් භූමියේ අවසරය සභාවෙන් ලබා ගන්නා ලෙසත්. ඉදිරිකිරිම් කරන්න බැහැ කියලා ප්‍රාදේශිය ලේකම්වරයා දැනුවත් කරන මෙන් ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා**

සුසාන භූමි නිතරම ශුද්ධ පවිත්‍ර කරනවා නම් සොහොන් භූමිය ආරක්ෂා කර ගන්න පහසුයි. භූමිය පුරාම මිනි භූමිදාන කිරීම් සිදු කරනවා නම් එවිට එය අල්ලා ගැනීමට අපහසුයි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සගීත් මධුසංඛ පිරිස් මහතා**

අළුත්ගම්ගොඩ සොහොන් භූමියේ මන්ත්‍රීවරුයෙකුගේ අනුදැනුම මත වොලිබෝල් කෝඩ් එකක් ඉදිකරලා තියෙනවා. මම දන්න විදිහට සොහොන් භූමි ආඥා පනතේ හැටියට කිසිදු ඉදිකිරීමක් සිදු කරන්න බැහැ. මම කැමතියි දැනගන්න ඒ සඳහා කවුද අනුමැතිය දුන්නේ කියලා. ඒ වගේම මෙම වොලිබෝල් කොඩ් එක සඳහා මුදල් වෙන් වෙලා තියෙනවා මං දන්න විදිහට. නමුත් කිසිදු ඉදිකිරීමක් සිදු වෙලා නැහැ. මේ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රි එක සභාවට ඉදිරිපත් කරන ලෙස දන්වා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සභා යෝජනාවක් දාලා අනුමත කරලා ඔය ඉඩම එල්.ආර්.සී. ඉඩමක් සභා අරමුදල් මගින් නෙමෙයි මෙම කටයුත්ත සිදු කලේ මන්ත්‍රීවරයෙකුගෙ ප්‍රතිපාදන මගින් වෙන්න පුළුවන්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා**

මේ සඳහා මුදල් පාස් වෙලා තියෙනවා. මෙය ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් මම දන්නේ නැහැ එල්.ආර්.සී. ද කියන්න මේ සම්බන්ධයෙන් ඉන්වෙන්ට්‍රියක් තියෙන්න පුළුවන් නේද.

**ගරු ප්රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඒ පිළිබඳව වාර්තාවක් ඉදිරි සභා වාරයකදි ලබාදිමට කටයුතු කරන්නම්. අදියර කිහිපයකදී තමයි ඒ සඳහා මුදල් පාස් වුනේ. මම දන්න විදිහට වැඩිහිටි සමිතියක් තමයි අත්සන් කලේ ඔබතුමාට නවුත්තුඩුව වැඩිහිටි සමිතිය මගින් තොරතුරු ලබා ගැනිමට පුළුවන්, අපේ පාලන කාලයේ දී නෙමෙයි මන්ත්‍රීතුමා වැල්කන්දල සොහොන් භූමිය මැන්නේ මීට පෙර කොමසාරිස් පාලනය කාලේ තමයි මන්ත්‍රීතුමා මෙය මැනලා තියෙන්නේ. අපට තියෙන්නේ මැනුම් කටයුතු ඉවර කරලා මෙය අත්පත් කර ගැනිම විතරයි. සොහොන් කොත් අපට කඩා ඉවත් කිරිමට කාගෙන්වත් අවසර ගන්න අවශ්‍ය නැහැ මොකද අපෙන් කිසි කෙනෙක් අවසර අරගෙන නැහැ. නඩු කටයුුත්තක් තියෙන එ්වා ඉතුරු කරලා අනෙක් ඒවා කඩා ඉවත් කිරිමට හැකියාව තියෙනවා. අපි මීට පෙරත් බෝඩ් ගහලා තියෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා**

අළුත්ගම්ගොඩ දෙල්ගස්ගොඩ කියන ප්‍රදේශයේ තියෙනවා පර් 40ක පමණ සොහොන් බිමකට අයිති ඉඩමක් එය පවරගන්න පුළුවන් නම් ඒ ගැන අවධානය යොමු කරන්න.

**තීරණය - ඊ.1.14 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.15 මතුගම වත්ත, ආදාගල පාරේ පිහිටි මතුගමවත්ත ඉඩමෙහි දැනට මුඩු ඉඩම් ලෙස අක්කර ½ක ප්‍රමාණයක් ඇත. එම ඉඩම ගොඩකර පාසල් ළමුන් ප්‍රවාහනය කිරිමේ

බස්රථ නවතා තැබීමට සකස් කරදී ආදායම් උත්පාදන මාර්ගයක් වශයෙන් නඩත්තු කිරීමට ගරු සභාවට යෝජන කරමි

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

මෙම ඉඩම කා සතු ඉඩමක්ද, එය අපට සංවර්ධනය කිරීමට අයිතියක් තියෙනවාද.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම ඉඩම සුළු නගර සභා කාලයේ දි යෝජනා කරලා ඉඩම් ගෙවල් හදන්න තමයි දිලා තියෙන්නේ ඒ කාල සීමාව තුළ. දිලා තියෙන්නේ දිස්ත්‍රික් ආණ්ඩුකාර ජ්ජන්ත වික්‍රමසිංහ පතිරණ මහතා විසින් අක්කර 7යි රූඩ් 3ක් 1962.04.28 වන දින තමයි අපට පවරලා දිලා තියෙන්නේ . දැනට මෙතන තියෙන කිරිහල, ඊට එහා පැත්තේ පශු වෛද්‍ය කාර්යාලය, පෙර පාසල ඒ සියල්ල තියෙන්නේ අපේ ඉඩමක්. මෙම ඉඩම සංවර්ධනය කරලා අවශ්‍ය කටයුතු කිරිමට ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් අපි අවසරය ලබාගෙන තියෙන්නේ.

**තීරණය -** ඊ.1.15 **යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ1.16 "805 ඒ මතුගම බටහිර ග්‍රාම නිලධාරි වසමේ මතුගම-නැබඩ පාරේ අළුබෝගහවත්ත අස්වැද්දුම, කොස්වත්තගොඩ ලන්ද, සහ කැටකැරුල්ලගහලන්ද, අළුබෝගහදෙනිය නම් අක්කර 05, රූඩ් 01, පර්චස් 38.06 කින් යුත් පෞද්ගලික අයිතිය පවතින වගුරු සහිත භූමිය මතුගම නගර සැලසුම් සඳහා අවශ්‍ය ආකාරයට කොටස් වෙන් විය යුතු ස්ථානය තීරණය කිරීමේ අභිමතය මතුගම ප්‍රාදේශීය සභාවට පවතින පරිදි ඉඩම් හිමියන් සහ මතුගම ප්‍රාදේශීය සභාවේ එකඟතාවය මත එළඹෙන ගිවිසුම ප්‍රකාරව මූල්‍යමය හිමිකම් පෑමකින් තොරව මතුගම ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමටත්, සම්පූර්ණ ඉඩම සංවර්ධනය කිරීමෙන් පසු හිමිකම් $^{2}/_{3}$ ක් සභාවටත්, $^{1}/_{3}$ක් හිමිකරුවටත් ලබා දීම සඳහා අවබෝධතා ගිවිසුමකට බැඳී ඇත.

එකී ඉඩමේ "මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් මතුගම නගරයේ නගර සංවර්ධනය උදෙසා රථවාහන නැවතුම් මධ්‍යස්ථානයක් ස්ථාපිත කිරීම."

ව්‍යාපෘති යෝජනාව ගරු සභාවේ අනුමැතිය සඳහා යෝජනා කරමි.

**(ඇමුණුම 02)**

ඉඩම් සඳහා ගිවිසුම් ගත වූවන්ගේ නාම ලේඛනය -

01. සුමිත් සේනානායක මහතා
02. සුජීව සේනානායක මහතා
03. කපිල කීර්ති මුණසිංහ මහතා
04. නදීජා ලක්ෂ්මි මුණසිංහ මහත්මිය
05. චමර චින්තක මුණසිංහ මහතා
06. පාලිත රාජකරුණා මුණසිංහ මහතා

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ1.16 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.1.17 MPS/3/10/ZA-2657 ගොනුව අනුව දැනට ක්‍රියාවිරහිතව ඇති හා විමර්ශනයක් වෙමින් පවතින සභාව සතු ZA-2657 අංක දරණ ජේ.බී.බී. යන්ත්‍රය අළුත්වැඩියාව සඳහා යොමු කිරිමට පළාත් පාලන කොමසාරිස් අංක LGD/10B/05/P29 හා 2025.07.14 දිනැති ලිපිය මගින් අනුමැතිය ලැබි ඇත. ඒ අනුව මෙම ජේ.සී.බී. යන්ත්‍රය නිසි ක්‍රමවේදයකට අළුත්වැඩියාව සඳහා යෙදවිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චන්දිමා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මේ යෝජනාවට එකඟ වෙන්න බැහැ. මෙම විමර්ශනයේ තත්ත්වය පිලිබඳව අදාල නිලධාරින්ගෙන් විමසා ඒ පිළිබඳව තොරතුරුදැන ගැනිම සඳහා කාලය අවශ්‍ය බැවින් මෙම යෝජනාව කල් තියන ලෙස ගරු සභාවෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම යෝජනාව මට ඉල්ලා අස්කරගන්න අවශ්‍ය නැහැ මොකද මෙම යන්ත්‍රය අළුත්වැඩියා කිරිම සඳහා පළාත් පාලන කොමසාරිස් අංක LGD/10B/05/P29 හා 2025.07.14 දිනැති ලිපිය මගින් අපට අවසරය ලැබිලා තියෙනවා නමුත් අපට මේ ජේ.බී.බී. යන්ත්‍රය අළුත්වැඩියා කටයුතු සිදු කිරිමට අවශ්‍යව තියෙනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

ලිපියට අනුව අනුමැතිය ලැබි ඇති බව පැහැදිලියි. නමුත් අපට විමර්ශනයේ තත්ත්වය සොයන්න ඕන. ඒ නිසා කල් දෙන්න පුළුවන් නම් අපි මේ සම්බන්ධව විමර්ශන තිබියදි හැදුවට කමක් නැද්ද, විමර්ශනයේ තත්ත්වය මොකක්ද, පළාත් පාලන කොමසාරිස්ගේ ඉල්ලීම කලේ කවුද, අපිට කිසිම ප්‍රශ්නයක් නැහැ. නමුත් අපට මේ සම්බන්ධව සොයා බැලීම සඳහා කාලය අවශ්‍යයි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

මේ විමර්ශනය තව අවුරුද්දක් හෝ දෙකක් ඇදුනහොත් නැත්නම් අවුරුදු 05 තිබ්බොත් මේ ජේ.සි.බී. යන්ත්‍රය මේ විදිහට තියෙන්න ඕනද 2023 ප්‍රාදේශිය සභාව විසුරුවා හැරියාට පස්සේ ඇත්තටම අපේ ගම් වලට වැඩක් කරගන්න බැරි වුණා. එම නිසා විමර්ශනය අවසන් වන තෙක් මෙය අදින එක කිසිම තේරුමක් නැහැ අවසරයක් ලැබිලා තියෙනවා නම් මේ කටයුත්ත සිදු කරලා මෙම ජේ.සි.බි. යන්ත්‍ර මගින් ග්‍රාම නිලධාරි වසම් 57 වැඩකටයුතු කරන මෙන් ගෞරවණිය ඉල්ලිම මම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

ජේ.සි.බී. යන්ත්‍රය සම්බන්ධයෙන් මගේ අදහස මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවලට බාධාවක් වෙලා තියෙනවා. මෙය අළුත්වැඩියා කළයුතුයි අනිවාර්යයෙන්ම ඒ සම්බන්ධයෙන් කිසිදු ගැටළුවක් නැහැ. විමර්ශන කටයුතු ගොඩක් වෙලාවට හමස් පෙට්ටිවල හිර වෙලා තියෙන්නෙ. මෙම විමර්ශනයත් බස්නාහිර පළාත් සභාවේ හමස් පෙට්ටියේ හිරවෙලා තියෙන්නේ මම හිතන්නේ. අළුත්වැඩියා කිරීම සම්බන්ධයෙන් කිසිම විරෝධතාවයක් නැහැ. මේ සම්බන්ධයෙන් ඇති විමර්ශනයේ තත්ත්වය පිළිබඳ වාර්තාවක් ඉදිරි සභාවේ දී ලබා දිමට හැකි නම් එය ප්‍රමාණවත් යැයි මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කොමසාරිස්තුමිය මේ සම්බන්ධව නොදැන නෙමෙයි මෙම ලිපිය නිකුත් කර තියෙන්නේ. මෙම විමර්ශනය මේ වන විට යනවා. එම නිසා එතුමිය අපට ජේ.බී.බී. යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට අවසර ලබා දී තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ද වික්‍රමනායක මහතා**

මෙම ජේ.බී.බී. යන්ත්‍රය අළුත්වැඩියා කිරිමට සියළු දෙනාගේම එකඟතාවය මත මෙම අළුත්වැඩියාව කරමු කියලා මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

මෙම ජේ.බී.බී. යන්ත්‍රයේ අළුත්වැඩියාව සිදු කරන්න. නැත්නම් අපිට ගමේ ඉන්න බැරි වෙනවා. එම නිසා අභිනවයෙන්ම මෙම අළුත්වැඩියාව කරන මෙන් මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙහි පවතින නීතිමය තත්ත්වය හා අපි දකින්නේ පළාත් පාලන මන්ත්‍රීවරුන් හැටියට අපට එන්න පුළුවන් අනතුර අනුව අපිට අවම වශයෙන් කල් දෙන්න. නැත්නම් ඔබතුමාගේ බහුතරයේ කැමැත්ත සලකා බලා ඉදිරි කටයුතු කරන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

යාන්ත්‍රික ඉංජිනේරු වාර්තාවක් ලබාගෙන ඉදිරිකටයුතු කරන්න එවිට කිසිදු ප්‍රශ්නයක් නැහැ. මම විමර්ශන නිලධාරින්ට කතා කළා එවිට කිවුවේ ෆයිල් එක තියෙන්නේ පළාත් සභාවේ කියලා. එම නිසා මෙය අත්‍යවශ්‍යයෙන්ම කරන්න අවශ්‍ය දේවල්. ඒ නිසා සද්භාවයෙන් මේ සම්බන්ධයෙන් සලකා බලා ඉදිරිකටයුතු කරන්නත.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

ඔබතුමා මාසයක් ඉල්ලනවා ඒක ඇත්ත. නමුත් අපි කාලය නාස්ති නොකර ඉදිරියට වැඩ ටික අරගෙන යමු.

**තීරණය - ඊ.1.17 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.1.18 PE-6914 දරණ වාහනය සඳහා ඩීසල් ලීටර් 500ක උපරිමයකට යටත්ව ලබා ගැනිමට ගරු සභාව යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.1.18 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ.02 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.2.1 ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ප්‍රධාන නගරය වන මතුගමට පිටතින් පැමිණෙන වෙළඳුන් නවතා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.2.1 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.2.2 මතුගම නගරයේ උපකාරක පන්ති පවත්වන ස්ථාන අනතුරුදායක තත්ත්වයේ පවතින බැවින් ඒවා තාක්ෂණ නිලධාරි හරහා තත්ත්ව පරික්ෂාවක් කරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් අපි තාක්ෂණ නිලධාරින් හරහා ක්‍රියාත්මක වෙමින් ඉන්නේ. මතුගම නගරයේ තියෙන සියළුම පෞද්ගලික පන්ති පවත්වන ස්ථාන වල තත්ත්ව පරික්ෂාවක් ලබා ගැනිමට තාක්ෂණ නිලධාරින් යොදවලා තියෙන්නේ.

**තීරණය - ඊ.2.2 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.2.3 රන්නගල ඇල්ල සභාවට පවරා ගන්නා මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දූලන්ත වික්‍රමනායක මහතා විසින් මෙම යෝජනාව ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ඩී. රෝහිත මහතා**

සභාපතිතුමා, මෙම රන්නගල ඇල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා තමයි සංවර්ධනය වන්නේ. ඒක අපි සභාවට පවරාගෙන හරි ක්‍රමවේදයකට ඉදිරියට ක්‍රියාත්මක කරගෙන යමු. වාහන ගාල් කරන ස්ථාන විධිමත්ව සකස් කරලා ජනතාව පිඩාවට පත් නොවන ආකාරයට සකස් කරන ලෙස මම ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම රන්නගල ඇල්ල පිහිටා ඇති ඉඩම ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව සතු ඉඩමක්. මේ වන විට මධ්‍යම පරිසර අධිකාරිය විසින් තමයි මෙහි වැසිකිළි පද්ධතියක් හදලා තියෙන්නෙ. දැනට ප්‍රාදේශිය ලේකම්තුමා විසින් අපට ලිපියකින් දීලා තියෙනවා මෙහි අවශ්‍ය කටයුතු, ප්‍රතිසංස්කරණ කටයුතු ඒ සියලු දේවල් අපට කරන්න පුළුවන් විදිහට.

**තීරණය - ඊ.2.3 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.03 **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.3.1 මතුගම ශ්‍රවණාගාරය ඉදිරිපිට පිහිටි භූමියේ රට, ජාතිය, ආගම බේරා ගැනිමට දිවිහිමියෙන් කැප වූ අභිත රණවිරුවන් සිහි කිරිම උදෙසා රණවිරු ස්මාරකයක් ස්ථාපනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණි මහතා**

එම ස්ථානය පමණක් අපට ලබාදෙන්න. රණවිරු ස්ථාමරකය ඉදිකිරිම සඳහා මුදල් අවශ්‍ය නැහැ සභාපතිතුමනි, රණවිරු සංසදය හරහා එය ඉදිකිරිමට හැකියාව අපට තියෙනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

මම නියෝජනය කරන කොට්ඨාසයේ මියගිය රණවිරුවන් වෙනුවෙන් අපි රණවිරු ස්මාරකයක් ඉදිකලේ 2008 වර්ෂයේදී. මෙම මන්ත්‍රීවරයා ඉදිරිපත් කරන ලද මෙම යෝජනාව යුතුකමක් හා වගකිමක්සේ සලකා ඉටුකරමු කියලා මම ප්‍රකාශකර සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කන්නන්ගර පිළිරුව ගාව තියෙනවා ඉඩ එම ස්ථානයේ හෝ වෙනත් සුදුසු ස්ථානයක එම කාර්යය ඉටුකිරිමට ඉදිරියේදී අවස්ථාව ලබාදෙන බව ප්‍රකාශ කර සිටිනවා.

**තීරණය - ඊ.3.1 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.3.2 ප්‍රාදේශිය සභාවේ පිහිටි නිදහස් ආයුර්වේද සේවාව ජනතාව අතර ප්‍රචලිත කිරිම සඳහා වැඩ පිළිවෙලක් සැකසිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණි මහතා**

ආයුර්වේද සියල්ල හා එක්ව සායන පැවැත්විම හා තෝරා ගන්නා ලද රෝගින් සඳහා ක්ලීනික් එකක් පවත්වාගෙන යාම හා ප්‍රාදේශිය ලේකම්තුමා දැනුවත් කර ඔප්පුවල ගැටළු තියෙන අය ඉන්නවා ඒ සම්බන්ධයෙන් ඔවුන්ව දැනුවත් කිරිම වැනි වැඩ සටහන මතුගම ප්‍රාදේශිය සභාව

විසින් සිදුකරන බව දන්වා ප්‍රචාරක කටයුතු කිරීම මගින් මහජනයා දැනුවත් කරන මෙන් දන්වා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චන්දිමා රුවනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය**

අවුරුද්දකට සැරයක් හෝ මාස 06කට සැරයක් මෙවැනි සායන පවත්වන්න අවස්ථාව තියෙනවා නම් ඒක හැමෝටම හොඳ අවස්ථාවක් වෙයි කියලා මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

ආයුර්වේදයේ ගැටළු අති බව ආරංචි වුණා ඒ සම්බන්ධව සොයා බලන ලෙස ඔබතුමා දැනුවත් කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

සේවක පිරිස වෙත අඩුපාඩු ඇත්නම් ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.ඒ.අමිල ගයාන් මහතා**

ආයුර්වේද සංරක්ෂණ සභාව මේ සම්බන්ධව දැනුවත් කරන්න පුළුවන් ඒ සඳහා සහභාගි වන ලෙස මා මේ අවස්ථාවේ කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රසික දුලන්ත වික්‍රමනායක මහතා**

මතුගම ඩිපෝව පාරේ තියෙන ආයුර්වේද මධ්‍යස්ථානය සභාව සතු ඉඩමක්ද, රජය සතු ඉඩමක්ද යන්න පැහැදිලි කරන්න පුළුවන්ද,

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බි.ඒ.අමිල ගයාන් මහතා**

එය කැකුලන්ද රජමහ විහාරයට අයත් ඉඩමක්

**තීරණය - ඊ.3.2 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ.04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.4.1 ලෙව්වන්දුව රාහුල ප්‍රාථමික විදුහල අසලින් ඇති පන්සල පාරේ විදි පහන් 03ක් අළුතින් සවි කිරීමට ගරු සභාවට යෝජනා කරමි. (ජයනෙත්ති, කපිල, කළුඅරච්චි යන අයගේ නිවෙස් අසල විදුලි කණුවලට)

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

ස්ථාන තුනක විදි පහන් සවිකර ගැනිමට අවශ්‍ය කටයුතු කරදෙන ලෙස ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

ඉදිරි කාලසිමාවතුලදී ලබා දිමට කටයුතු කරන්නම් මොකද අපි දැන් ගෙනාපු විදි පහන් නැහැ. මිලදී ගත් පසු සියළුම මන්ත්‍රීවරුන් වෙත ලැබිමට සලස්වනවා.

**තීරණය - ඊ.4.1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.4.2 ලෙව්වන්දුව බෙලිවත්ත කන්ද පාරේ ඇති සුසාන භූමිය මැන ඒ සඳහා වෙන් කර ඇති ඉඩම නිරවුල් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.4.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.4.3 ගොරක්ගොඩවත්ත මාර්ගය අවහිර වන පරිදි නිවසක් තනා ඇති තාප්පය පිළිබඳ පරික්ෂණයක් පැවැත්විමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.ඩී. චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

මෙම මාර්ගය ප්‍රාදේශීය සභාවට අයත් මාර්ගයක් මෙම තාප්පයෙන් මාර්ගයට අවහිර වන පරිදි ඉදිකරලා තියෙනවා. ඒ වගේම තාප්පයෙන් නිවසේ වතුර පාරට තමයි වැටෙන්නේ. මේ සම්බන්ධයෙන් පරික්ෂණයක් පවත්වන මෙන් ඉල්ලා සිටිමි

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම තාප්පය අනවසරයෙන් ඉදිකර ඇත්නම්. තාක්ෂණ නිලධාරින් යොදවලා මේ සම්බන්ධයෙන් පරික්ෂණයක් කිරිමට කටයුතු කරන්නම්.

**තීරණය - ඊ.4.3 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.4.4 ලෙව්වන්දුව කොස්ගහවිට මාර්ගය ප්‍රාදේශීය සභාවේ අනුමත මාර්ගයක් බවට පත් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. අනුෂා සන්ධ්‍යා කාන්ති මහත්මිය**

මෙම මාර්ගය මතුගම ප්‍රාදේශීය සභාවේ ලියවිලා නැහැ. එම නිසා සංවර්ධන කටයුත්තකදී අපි විවිධ ගැටළු වලට මුහුණ දෙනවා ඒ නිසා මෙම මාර්ගය සභාවට පවරා ගන්නා මෙන් ඉල්ලා සිටිනවා

**තීරණය - ඊ.4.4 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ-05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ-05.1 803 නාරවිල ග්‍රාම නිලධාරි වසමට අයත් නාරවිල කොරටුහේන මාවතේ මද්දෙගෙදර ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවෙන් ජනතාවගෙ ඉල්ලිම පරිදි ප්‍රාදේශිය සභාවට වෙන් කෙරුණු අක්කර 1යි රූඩ් 2ක ඉඩම් කොටස ප්‍රදේශයේ

තරුණ තරුණියන් වෙනුවෙන් ක්‍රිඩා පිටියක් ලෙස ප්‍රාදේශීය සභා ප්‍රතිපාදන යොදවා සංවර්ධනය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි චමිලාන් රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ-05.2 සභාව මගින් පවත්වාගෙන යනු ලබන ප්‍රජා මණ්ඩල නැවත සක්‍රිය කර ප්‍රදේශයේ ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන් ටෙන්ට් අඩි 20ක් පුටු 50ක් සියලු ප්‍රජා මණ්ඩල වෙත සභා ප්‍රතිපාදන මගින් ලබා දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දිමා රුචිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සභාවට මෙම ඉඩම පවරාගෙන ඉදිරිකටයුතු කරන්න. මෙම අක්කර 1යි රූඩ් 2ක ඉඩම් කොටස ප්‍රදේශයේ තරුණ තරුණියන් වෙනුවෙන් ක්‍රිඩා පිටියක් සකස් කිරිමටත් අක්කර 3ක ප්‍රමාණය සභාවට පවරාගෙන කුමන හෝ කාර්යයක් සඳහා යොදා ගන්නා ලෙස මම මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

ග්‍රාම නිලධාරි වසම් 57ම ප්‍රජා මණ්ඩල ස්ථාපිත කරලා අළුතින් හදනවා නම් හදලා තියෙන ඒවා ආපසු යථා තත්ත්වයට පත් කරලා සභාවේ ප්‍රතිපාදනයක් වෙන් කරන්න ටෙන්ට් අඩි 20ක් හෝ පුටු 50ක් ලබාදීමට කටයුතු කරන්න කියලා මම ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

ගරු සභාපතිතුමනි, ගරු ස්වාමින් වහන්සේගේ ටෙන්ට් අඩි 20 පුටු 50 ක් ප්‍රජා මණ්ඩල වෙත ලබාදිම මම එය අගේ කරනවා. නිලධාරින් සඳහා පදනම් විරහිත චෝදනා ඉදිරිපත් කිරිම නොකරන ලෙසත් කුමන හෝ සිදුවිමක් පදනම් කරගෙන තොරතුරු තියෙනවා නම් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ගයකට යමු කියලා තමයි මම කිව්වේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පි.ඩී. අමන් ප්‍රසාද් වික්‍රමසිංහ මහතා**

ක්‍රිඩා පිටිය සම්බන්ධ යෝජනාව ඉතා කලෝචිතයි. ප්‍රාදේශීය සභාවේ ප්‍රතිපාදන යටතේ සංවර්ධනය කිරිමට යෝජනා සම්මත වුණා.

ප්‍රජා මණ්ඩල සම්බන්ධව සාකච්ඡා කලා. ඉස්සර අපේ ගම් වල ප්‍රජා මණ්ඩල සක්‍රියව පවත්වාගෙන ගිහින් තියෙනවා මෙවර ප්‍රජා මණ්ඩල පිහිටු විමේදී හිටපු ප්‍රජා මණ්ඩල නිලධාරින් දැනවත් නොකිරිම කණගාටුවට කරුණක්.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

නිලධාරින් දැනුවත් නැහැ කියන එක පිළිගන්න බැහැ. මම ප්‍රජා මණ්ඩල පිහිටුවන අවස්ථාවේ දී මම සහභාගි වුණා. හිටපු සභාපතිතුමා ඒකට සහභාගී වුණා. හිටපු සමාජිකයෝ කිහිප දෙනෙක් සහභාගි වෙලා තමයි පිහිටෙවුවේ .

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

මගේ ගමේ ග්‍රාම සංවර්ධන සමිතිය පිහිටෙව්වා, යෞවන සමාජ පිහිටෙව්වා, සිවිල් ආරක්ෂක කමිටුව පිහිටෙව්වා, මේ සම්බන්ධව කොට්ඨාසයේ මන්ත්‍රීවරයා දන්නේ නැහැ. මම කියනවා මේ අවස්ථාවේදී කොට්ඨාස මන්ත්‍රිවරයා දැනුවත් කරන ලෙස.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මෙම 05.1 හා 05.2 යෝජනා දෙකම හොද යෝජනා දෙකක් මේ සම්බන්ධව විරුද්ධත්වයක් නැහැ. මෙතන ප්‍රශ්නය තියෙන්නේ මේ දේවල් සභාවට කරන්න පුළුවන් දේවල්ද කියන එකයි. සභාව සතු ටෙන්ට් පුටු තියෙනවද හදිස්සියකට දෙන්න පුළුවන්ද. මේ සියළු සමිති පිහිටුවිම සඳහා ප්‍රාදේශීය ලේකම්වරයා යටතේ නිලධාරින් ඉන්නවා එම නිලධාරින් විසින් තමයි මෙම සමිති පිහිටුවන්නේ. ඒ සඳහා චක්‍රලේඛ තියෙනවා එහි තියෙනවා කැඳවන්න ඕන නිලධාරින් කවුද කියලා. ඒ නිසා මම හිතනවා එම චක්‍රලේඛනය කියවලා කතා කරනවා නම් මම හිතනවා මේගැන සභාවේ කතා කරන්න අවශ්‍යයයිද කියලා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එල්. රංජිත් සිල්වා මහතා**

මගේ කොට්ඨාසයේ ආරක්ෂක කමිටුව පිහිටුවලා තිබ්බා නමුත් මට ආරාධනා කලේ නැහැ පසුව මම හොයලා බැලුවා එවිට මට ආරංචි වුණා දේශපාලන අධිකාරිය වෙත ආරාධනා කරලා නැහැ. මම පොලිසියෙන් ඇහුවා අපව සම්බන්ධ කර නොගන්නේ ඇයි කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

එම චක්‍රලේඛනයේ නැත්නම් කැඳවන්න ඔවුන්ට ඔබතුමාව කැඳවන්න බැහැ. මෙතනදි අපි කරන්න ඕන මේ සම්බන්ධ යෝජනාවක් ගේන්න ඕන අදාළ අමාත්‍යාංශ්‍ය වෙත දැනුවත් කිරිම සඳහා ඒ සඳහා අපි ඔබතුමාට සහයෝගය ලබාදෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණී මහතා**

මේ සඳහා කවුරුවත්ම සහභාගි වුනේ නැද්ද. සහභාගි වුණානේ අන්න ඒ විදිහට අපිවත් දැනුවත් කරා නම් හරිනේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා**

ඇත්තටම එහි ලේකම්වරිය ඉන්නේ ගමේ ග්‍රාම නිලධාරිවරයා එවිට ඔවුන් තමයි ගමේ මිනිසුන් දැනුවත් කරන්නේ නැවත ප්‍රතිසංවිධානය කරනවා නම් ඒ සම්බන්ධව. ගමේ දින 14කට පෙර පෝස්ටර් ගහනවා ගම පුරාම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

සභාපතිතුමා ඔබතුමාගේ පක්ෂයෙන් ඡන්දය ඉල්ලපු තිසේරා මහත්තයා තමයි මගේ කොට්ඨාසයේ පොලිස් කමිටුවේ සභාපති එතන කිසිම ප්‍රශ්නයක් නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ සම්බන්ධයෙන් බොහෝ මන්ත්‍රීවරුන් විසින් විවිධ චෝදනා ඉදිරිපත් කරලා තියෙනවා. නමුත් මට මේ සම්බන්ධයෙන් මැදිහත් විමට හැකියාවක් නැහැ. මොකද එය සිදුකරන්නේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා එයි සිදුවන්නේ. මම සභාපති වුවත් මගේ කොට්ඨාසයේ පිහිටවු ග්‍රාම නිලධාරි, ආක්ෂක කමිටුවක් වත් ග්‍රාම සංවර්ධන කමිටුවක් වත් මාව දැනුවත් කරලා නැහැ.අපිව දැනුවත් කිරිමට ඔවුන්ට කියලා නැතුව ඇති එම නිසා මේ සම්බන්දව දිගින් දිගටව කතා කරලා වැඩක් නැහැ. මම මේ සම්බන්ධයෙන් ප්‍රාදේශීය ලේකම්තුමා දැනුවත් කරන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දූල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

මේ සිද්ධිය හැමතැනම වෙලා තියෙනවා. මේ සම්බධයෙන් ඉදිරියේදී විසදුමක් ලබාදෙන්න කියලා මම කියා සිටිනවා

**තීරණය - ඊ-05.2 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ.06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.06.1 මද්දෙගෙදර පාරෙහි අතුරු මාර්ගයක් වන බෝධිරුක්ඛාරාම විහාරයට යන මාර්ගය හා මද්දෙගෙදර පාරෙහිම අතුරු මාර්ගයක් වන රුවන් දිසානායක මහතාගේ නිවස අසලින් කදිරංදොළ වෙල් යාය මැදින් වැටි ඇති මාර්ගයට සම්බන්ධ වන පරිදි යාකර මිටර් 300ක් වන එම කොටස කොන්ක්‍රිට් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා**

මේ යෝජනාවට අනුව මාර්ගයේ අඩුපාඩු සම්පූර්ණ කර මේ මාර්ගයේ ඉදිරි සංවර්ධන කටයුතු සිදුකරන ලෙස දන්වා සිටිමි

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ යෝජනාව සම්බන්ධයෙන් වාර්තාවක් ලබා දෙන ලෙස කියා සිටිනවා

**තීරණය - ඊ.06.1 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

ඊ.06.2 ඉහත යෝජනාවේ සඳහන් කදිරන්දොළ වෙල් යාය මැදින් වැටි ඇති රුවන් දිසානායක මහතාගේ නිවස අසලින් ඇති මිටර් 100ක් පමණ වන මාර්ගය පස් යොදා පිළිසකර කර කොන්ක්‍රිට් කිරිමට ද ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.06.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.06.3 අළුත්ගම පාරට සම්බන්ධ වන මද්දෙගෙදර පාර ආරම්භයේ සිට එම මාර්ගයේ දෙපස පැති කාණු පද්ධතියේ මෙතෙක් කොන්ක්‍රීට් යොදා සකස් කර නොමැති ස්ථාන හා මෙතෙක් කාණුව සකස් නොකළ ස්ථාන පවා සකස් කර කොන්ක්‍රීට් යොදා සකස් කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.06.3 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.06.4 805ඒ වසමට අයත් වැල්කන්දල මාර්ගයේ සිට සෙන්දනායක මාර්ගය දක්වා මීටර් 550ක් පමණ වන වික්‍රම මාවතේ තාර දමා තිබුණද තැනින් තැන කඩතොළු වී පවතින හෙයින් එය කාපට් කර සංවර්ධනය කිරිමටද එම පාරෙහි උඩ පැත්තේ අඩක් නිමකර ඇති කාණු පද්ධතිය හා බෝක්කු පිළිසකර කර සංවර්ධනය කිරිමට ද ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. දූමිදු චතුර සම්පත් මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ මාර්ගය සංවර්ධන කටයුතු සඳහා යොමුකරලා තියෙන්නේ ඉදිරි කාලසිමාව තුල මෙම මාර්ගය සංවර්ධනය කරන්න බලාපොරොත්තු වෙනවා. එම කාණු පද්ධතිය සංවර්ධනය කිරිමට බැහැ. මේ සම්බන්දව විදිමත් පරික්ෂණයක් කර සිදු කිරිමට බලාපොරොත්තු වෙනවා

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. දූමිදු චතුර සම්පත් මහතා**

මෙතුමා කියන පාර හා කාණු පද්ධතිය ඉක්මණින්ම සංවර්ධනය කළයුතුයි. මේ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය - ඊ.06.4 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.06.5 805ඒ, 805ඊ හා 805 සී යන මතුගම බටහිර පළාත් පාලන බල ප්‍රදේශයේ ඇති වසම් වල සියළු අතුරු මාර්ග වල දෙපස තණකොළ හා අනෙකුත් දෑ ඉවත් කර පිරිසිදු කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ සම්බන්ධයෙන් අවශ්‍යා කටයුතු සිදුකරමින් ඉන්නේ.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ඩී. නිශාන්ත මහතා**

මේ සම්බන්ධයෙන් ප්‍රදේශවාසින් මගෙන් ඉල්ලීම් කරා. එම නිසා තමයි මම මෙම යෝජනාව ඉදිරිපත් කලේ. ඔබතුමා මේ සම්බන්ධයෙන් ක්‍රියාකිරිම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා.

**තීරණය - ඊ.06.5 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ.07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.07.1 අක්කර 29 ½ සමන්විත ඉඩම් කට්ටි 290වකට බෙදා වෙන්කර ඇති සිහිලැල්තැන්න පළමු අදියරෙහි පොදු කටයුතු වෙනුවෙන් වෙන් කර ඇති අක්කර 2 ½ පමණ පොදු භූමි කොටසේ ක්‍රිඩා පිටියක්, බුදු මැදුරක්, ළමා හා මාතෘ සායනයක් පෙර පාසලක් මෙන්ම සුසාන භූමියක් ද පවත්වාගෙන යනු ලබයි. ගම්වාසින් විසින් දැනට අවුරුදු 22ක (2002 වර්ෂයේ සිට) පමණ කාලය සිට ගම්වාසින්ගේ මෘත දේහ භූමිදානය කළ ඇති පොදු කටයුතු සඳහා වෙන් කළ, භූමි කොටස හා මේ වන විට මෘත දේහයන් 11ක් පමණ භූමිදානය කර ඇති යාබද රක්ෂිත ඇතුල් කට්ටියේ (Reservation) බිම් කොටසක් යන බිම් කොටස් දෙකම ප්‍රාදේශීය සභාවට පවරාගෙන පොදු සුසාන භූමියක් ලෙස ලියාපදිංචි කොට ගම්වාසින්ගේ ප්‍රයෝජනය සඳහා ලබාදෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ සම්බන්ධයෙන් ඉදිරි සභා වාරයකදී වාර්තාවක් ලබාදෙන්නම්.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

අපේ මන්ත්‍රීතුමා කියන්නේ ක්‍රිඩා පිටියක්, බුදු මැදුරක්, ළමා හා මාතෘ සායනයක් පෙර පාසලක් තියෙනවා මෙහි පොදු ඉඩමේ ඉතුරු ටිකේ මිනි වලලනවා මෙය සුසාන භූමියක් ලෙස වෙන්කරලා දෙන්න කියලා කාරුණික ඉල්ලිමක්. මෙන්න මේ සභාවෙන් ගිහිල්ලා Reservation වෙන් කරලා වැටක් ගැහුවේ ඇයි, කාගේ වුවමනාවටද යන්න දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

ඉඩම් කට්ටිකරුවන්ට පොදු පහසුකම් කියන තැන ඉදලා තමයි මේක කළමනාකරණය කලේ. ක්‍රිඩා පිටියක්, බුදු මැදුරක්, ළමා හා මාතෘ සායනයක් පෙර පාසලක් ඉදි කලේ. සුසාන භූමියේ කම්බි ගැහුවේ ලේකම්තුමියට ඉහලින් ලැබුණු නියෝගයක් අනුව මෙම කටයුත්ත සිදුකරන ලද්දක් වෙන්න ඕන.

**තීරණය - ඊ.07.1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.07.2 බොන්දුපිටිය කොට්ඨාසය නේවාසික ඉඩම් 14ක් පමණ මතුගම ප්‍රාදේශීය සභාවේ අනුමැතිය සහිතව වෙන්දේසි කොට මේ වන විට පවුල් 1000කට අධික ප්‍රමාණයක් හා 771/ඒ කැප්පෙට්ටිගහලන්ද, 771 බොන්දුපිටිය, 771/බී තල්ගස්ගොඩ ග්‍රාම

නිලධාරි වසම් වල පවුල් 1500කට අධික ප්‍රමාණයක් ජීවත් වන අතර සෑම නේවාසික ඉඩමක්ම පර්චස් 10, 12, 15 ආදී කුඩා ඉඩම් බැවින්ද සෑම ඉඩමක්ම නිවස, ළිඳ, වැසිකිළි වල පිහිටා ඇති බැවින් කුණු කසළ බැහැර කිරිමේ දී දැඩි අපහසුතාවයකට පත්ව ඇති අතර දැනට වලගෙදර දක්වා පමණක් සීමා වී ඇති කසළ එකතු කිරිමේ ට්‍රැක්ටර් රථය මතුගම ප්‍රාදේශීය සභාවේ අවසන් වන සිමාව බෝන්දුපිටිය හන්දිය දක්වා යොදවන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

ඔබතුමාගේ විශේෂ අවධානය යොමුකර මෙම කුණු කසළ බැහැර කිරිම සම්බන්ධව ස්ථිර විසඳුමක් ලබා දෙන මෙන් ගෞරවයෙන් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා**

විශ්විත උයන කුරුදිප්පිට ප්‍රදේශයේ ජනතාවටත් කුණු කසල දැමීමට ස්ථානයක් නොමැති බැවින් ඒ සම්බන්ධයෙන් ඔබතුමාගේ අවධානය යොමුකරන මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ කාරණා සම්බන්ධයෙන් සැලසුම් කමිටුවේදීත් අපි සාකච්ඡා කලා. අපි මේ වන විට හඳුනාගෙන තියෙන්නේ මේ සම්බන්ධව. මෙම ප්‍රදේශය මුලින්ම වරිපනම් කලාපයක් බවට පත්කළයුතු කාරණාව මෙම අවශ්‍යතාවය හැකි ඉක්මණින් ඉටු කළයුතුයි. අපිට ප්‍රධාන ගැටළුව කොම්පෝස්ට් අංගනයේ මෙම කුණු කළමනාකරණය කර ගැනිමට නොහැකිවිම. විධිමත් පරිදි කළමනාකරණය කර ගැනිමට යථා තත්ත්වයට පත් කර ගැනිමට කටයුතු කරමින් සිටිනවා. මේ සඳහා කාලයක් දෙන්න.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා**

මේ සම්බන්ධයෙන් ඔබතුමා සොයා බලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගනිමින් සිටිම වෙනුවෙන් ස්තූතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

ඔබතුමා ක්ෂණික විසඳුමක් ලබා ගැනිම වෙනුවෙන් ස්තූතිවන්ත වෙනවා. සතියකට එක් වරක් හරි කසළ එකතුකරන ට්‍රැක්ටර් රථය එවන්න පුළුවන් නම් බොහොම ස්තූතියි

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එල්.එල්. රංජිත් සිල්වා මහතා**

කර්මාන්ත පුරයේ විශාල ඉල්ලිමක් තියෙනවා ට්‍රැක්ටරය ගෙන්න ගන්න ඒ සඳහා මුදල් ගෙවන්න වුවද අපි සුදානම්. එම නිසා සතියකට සැරයක්වත් ට්‍රැක්ටරය එවන්න පුළුවන් නම් බොහොම ස්තූතියි.

**තීරණය -** ඊ.07.2 **යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ.08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.08.1 මතුගම ප්‍රාදේශීය සභාවට අයත් වැලිකැටිය පාර සුසාන භූමිය, පෙත්තකන්ද සුසාන භූමිය ඇතුළු සියළුම සුසාන භූමි වහාම එළි පෙහෙලි කොට, පවතින අනතුරුදායක ගස් කපා ඉවත් කළයුතු බවත්, ප්‍රාදේශීය සභාවට අයත් සියළු සුසාන භූමි මැනුම් කටයුතු සිදුකර නැවත මායිම් සළකුණු කළයුතු බවත්, එකී සුසාන භූමිවල දැනට සිටින අනවසර හා දේපළ අවභාවිතාවන් වහාම ඉවත් කළයුතු බවත්, මෙම ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. සුජිත් කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.08.1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.08.2 මතුගම ප්‍රාදේශීය සභාවට අයත් මතුගම ශ්‍රී ලංගම ඩිපෝව අසලින් ගුරුපුරය දෙසට දිවෙන මාර්ගය ශ්‍රී ලංගම ඩිපෝව සහ කොන්නල්ස් උත්සව ශාලාව අතර කොටස පටු මාර්ගයක් ලෙස පවතින බැවින්, එකී කොටස පුළුල් කර ගැනිම සඳහා ශ්‍රී ලංගම මතුගම ඩිපෝවට ලබා දී ඇති භූමියෙන් ප්‍රමාණවත් තරමේ බිම් තිරයක් වෙන් කරවා දෙන ලෙස ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව වෙත දන්වා යැවිම සඳහා වූ යෝජනාව ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ සම්බන්ධයෙන් අපි ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලය වෙත ඉල්ලිමක් කරලා තියෙනවා මේ වන විට. මෙතන හයිටේෂන් විදුලි කණුවක් සවි කරලා තියෙනවා පාරේ අනෙක් පැත්තෙන් ඊ ලගට තියෙන ප්‍රශ්නය තමයි එතන තියෙන බුදු මැදුර. මේ සම්බන්ධයෙන් අපට ලැබෙන පිළිතුර අනුූව සංවර්ධන කටයුතු කිරිමට බලාපොරොත්තු වෙනනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසන් සභාව වෙත ලිපියක් මගින් දැනුවත් කිරිමට කටයුතු කරන්නම්

**තීරණය - ඊ.08.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.08.3 මතුගම ප්‍රාදේශීය සභාවට අයත් පෙර පාසැල් වල සේවය නියුතු පෙර පාසැල් ගුරුවරුන්ට "ඔවුන් සේවයේ යොදවන සේවා කාලය හා ඔවුන්ගේ තනතුරු නාමය" සම්බන්ධව දැඩි අසාධාරණයකට මුහුණ දිමට සිදුව ඇති බව වාර්තා වේ. එසේ හෙයින් මෙම පෙර පාසැල් ගුරුවරුන්ට සිදුව ඇති අසාධාරණයන් වහාම ඉවත් කොට ඔවුන්ට සහන සැලසිය යුතු බවට වන යෝජනාව ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

මතුගම ප්‍රාදේශීය සභාවේ ගුරුවරුන් පෙර පාසල් පාලිකාවන් නොවෙයි. සෞඛ්‍ය කම්කරුවන්. මෙය හොඳ තත්ත්වයක් නෙමෙයි. එම ගුරුවරුන් විදිහට හොඳ මනසිකත්වයක් නැහැ. ඔවුන්ට තනතුරට අදාල රාජකාරි ලෙස සලකා සේවයේ යොදවලා තියෙනවා. දරුවන්ට අසාධාරණයක් සිද්ධවෙනවා මේ තත්වය හේතුවෙන්. මේ ඉල්ලීම ගුරුවරුන්ගේ ඉල්ලීමක් මෙන් ම දෙමාපියන්ගේ ඉල්ලීමක්. ඔවුන්ට සහන සැලසීම කළයුතු බව ගරු සභාවට යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

කෙනෙකුට රාජකාරියක් පැවරූ විට ඊට අමතරව තවත් රාජකාරියක් ඉටුකර ගන්න එක සාර්ථක නැහැ

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

සභාපතිතුමනි මේ සම්බන්ධයෙන් ඔබතුමා මැදිහත් වෙලා මේ ගුරුවරුන්ට සාධාරණයක් ඉටු කරලා දෙන්න. මෙය මානසික වදයක් ගුරුවරුන් සඳහා නිසි තනතුර ලබා දීමට අවශ්‍ය කටයුතු සලසා දෙන මෙන් ඔබතුමන්ගෙන් ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

පෙර පාසල් පාලිකාවක් කියන්නේ පාසල් ගුරුවරියකටත් එහා ගිය මනස වෙහෙසවලා වැඩ කරන තැනැත්තියක් එම නිසා මම ගෞරවයෙන් ඉල්ලා සිටිනවා ඔවුන්ට ඒ අවශ්‍ය නිදහස ලබා දෙන්න කියලා. ඒ වගේම තවමත් පෙර පාසල් ගුරුවරියන් ඉන්නවා ස්ථිර නොවිච්ච ඉතා අසාධාරණ තත්ත්වයකට පත් වුණා. ලලිති සිරිවර්ධන මන්ත්‍රීතුමා කිව්වා වගේ මෙහි සේවකයින් අදාල තනතුරේ පිහිටුවන ලෙස ඉල්ලා සිටින අතර සමහර සේවකයින් ඕන වෙලාවට එන්නත් යන්නත් තාමත් මේ සභාවේ ක්‍රියාක්මක වෙනවා. මෙම සභාව ආදර්ශවත් සභාවක් බවට පත්කිරිමට ඔබතුමා කටයුතු කරයි කියලා බලාපොරොත්තු වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මන්ත්‍රීතුමිය කවුද ඕන වෙලාවක එන්නත් යන්නත් පුළුවන් කිවුවේ කවුරුන් ගැනද යන්න දැන ගන්න කැමතියි. මම උදේ සිට සවස් වන තුරු මෙම සභාවේ රැදී සිටිනවා එවැනි කටයුතු සිද්ධවෙන් බැහැ කියලා සියළුදෙනා දැනුවත් කරලා තියෙන්නේ. මෙම පෙර පාසල් වල සිටි ගුරුවරුන්ට සාදාරණයක් ඉටු කිරිම සඳහා තමයි සෞඛ්‍ය කම්කරු ලෙස හරි ස්ථිර පත්විම් ලබා දිලා තියෙන්නේ. කාලසීමාව සම්බන්ධයෙන් ඉදිරියේදී විසඳුමක් ලබා දෙන්නම්.

**තීරණය - ඊ.08.3 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

**ඊ-09** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා විසින් යථා පරිදි කල් දී ඇති **යෝජනා**

යෝ-09.1 කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ආසනයේ අංක 12 ඉදිගස්තුඩුව මැතිවරණ කොට්ඨාසයේ වරකාතොල්ල ග්‍රාම සේවා වසමේ පිහිටා ඇති ප්‍රාදේශීය සභාවට අයත් වරකාතොල්ල පොදු සුසාන භූමියේ අවට ගම්මාන වල ජීවත් වන විශාල ජන කොටසක් සුසාන භූමිය පාවිච්චි කරයි.

ජනග්‍රහණය වැඩිවිම හේතුවෙන් සුසාන භූමියේ ඇති ඉඩකඩ අනුව අනාගතයේ දී මිහිදන් කිරිමේ ගැටලුවක් ඇති විමට ඉඩකඩ ඇති බව ඔබතුමා වෙත දන්වා සිටිමි.

මේ සියලු කරුණු සලකා බලා වරකාතොල්ල සුසාන භූමියේ නව ආදාහනාගාරයක් ඉදිකර දෙන මෙන් ඔබතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලයට කාරුණිකව යෝජනා කර සිටිමි.

පසුගිය ප්‍රාදේශීය සභා කාල සිමාව තුළ මේ සඳහා යෝජනාවක් ඉදිරිපත් කොට එවකට හිටපු මන්ත්‍රීවරුන් විසින් සභාවේ අනුමැතිය ලබා දී ඇති බව මා හට දැනගැනිමට හැකි වී තිබේ. ඔබතුමාගේ අවධානය මේ සඳහා යොමුකරන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. සනත් සංජිව මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

අපි සියළු දෙනාගේ අවධානය යොමුකරලා මේ කටයුත්ත ඉටුකරමු. පක්ෂ පාට බේදයකින් තොරව ප්‍රතිපාදන වෙන් කරවා ගැනිමට කටයුතු කරලා මෙම කාර්යය ඉටු කිරිමට කටයුතු කරන මෙන් ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

**තීරණය - යෝ-09.1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

යෝ-09.2 කළුතර දිස්ත්‍රික්කයේ මතුගම ආසනයේ අංක 12 ඉදිගස්තුඩුව මැතිවරණ කොට්ඨාසයේ දේවගොඩ ග්‍රාම සේවා වසමේ ප්‍රාදේශීය සභාවට අයත් දියහොරඩුව ග්‍රාමයේ පිහිටා ඇති ප්‍රජා ශාලා ගොඩනැගිල්ල පාවිච්චියට ගත නොහැකි අන්දමට විනාශ වි ඇත. එම ප්‍රජා ශාලා ගොඩනැගිල්ල අලුත් වැඩියා කිරිම සම්බන්ධව මතුගම ප්‍රාදේශිය සභාවේ වර්තමාන ලේකම්තුමියව දැනුවත් කර ඇති අතර එතුමියගේ අවධානය ලක්වී ඇත.

එතුමියගේ මැදිහත්විම තුළින් ජාතික ගොඩනැගිලි පරේක්ෂණ ආයතනය දැනුවත් කර ඇති අතර, එම ආයතනයද ස්ථානීය පරික්ෂණයක් කර ගොඩනැගිල්ල පිළිබඳව තත්ත්ව වාර්තාවක් ලැබී ඇති බව ලේකම්තුමිය විසින් මා වෙත දන්වමි.

මෙම ප්‍රජා ශාලාව දියහොරඩුව, දේවගොඩ ගම්මාන දෙකෙහි ජනතාවගේ අවශ්‍යතා වෙනුවෙන් උත්සව ශාලාවක් වශයෙන් පවත්වාගෙන ගිය ගොඩනැගිල්ලකි. මෙම ගොඩනැගිල්ල විදේශ ජාතික කාන්තාවක් මගින් සාදා නිම කොට ජනතාවගේ උන්නතිය වෙනුවෙන් එම ප්‍රදේශයට පරිත්‍යාග කරන ලද ගොඩනගිල්ලකි. එම

විශාල ගොඩනැගිල්ල ආරක්ෂා කර ගැනිමේ වගකීම ගම්මානයේ ජීවත් වන ජනතාව වගේම ප්‍රාදේශීය සභාවේ ද වගකිමකි. ඒ වගකිම ඉටුකරමින් කොට්ඨාශයේ වගකිම දරණ මන්ත්‍රීවරයකු හැටියට ජනතාවගේ පරිහරණය සඳහා අලුත්වැඩියා කර දෙන මෙන් ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

මෙම යෝජනාව ඉදිරිපත් කිරිම සම්බන්ධයෙන් ස්තූතිවන්ත වෙනවා. මෙම දියහොරඬුව ප්‍රජා ශාලා ගොඩනැගිල්ල යථා තත්ත්වයට පත් කිරිමට හැකි නම් මතුගම ප්‍රාදේශීය සභාව කරන ලොකු කාර්යයක් කියලා මම හිතනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා**

දියහොරඬුව ප්‍රජා ශාලා ගොඩනැගිල්ල ප්‍රතිසංස්කරණය වෙන්න ඕන ගොඩනැගිල්ලක් කියලා මම කියනවා. මෙම ආදාහනාගාරය සම්බන්ධ යෝජනාවත් ඉතා වැදගත් යෝජනාවක් බව මේ අවස්ථාවේ දී ප්‍රකාශ කරසිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

මෙම ඉඩම LRC ඉඩමක් අපිට පැවරුමක් කරලා නොතිබිච්ච ඉඩමක්. සභාවේ සම්මත කලා මෙම යෝජනාව ගෙනාවේ ගරු මන්ත්‍රී මිත්‍රානන්ද මහතා විසින්. LRC එකට ගිහින් සල්ලි බැන්දා, ඇස්තමේන්තු කරා, ප්ලෑන් එක ඇන්දා ඉන් අනතුරුව තමයි මහජනයා විරෝදතා දැක්වූවා.

දියහොරඬුව ප්‍රජා ශාලාවහොඳ නිර්මාණාත්මක ගොඩනැගිල්ලක්. මේ සමබන්ධයෙන් ගොඩනැගිලි පරියේක්ෂණායතයෙන් වාර්තාවක් ලබාගෙන තියෙනවා ලේකම්තුමිය ගොඩනැගිල්ල සංවර්ධනය කටයුතු සඳහා අවසරය ලබා දී තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජේ එරංග කරවිට මහතා**

ගොඩනැගිල්ලට අමතරව හොද සංස්කෘතික උත්සවයක් පැවැත්විමට හොඳ ස්ථානයක්, ගොඩනැගිල්ලට අමතරව හොඳ ඉඩ ප්‍රමාණයක් තියෙනවා මෙම ස්ථානයේ. එබැවින් ක්ෂණිකව ක්‍රියාත්මක වී ඉදිරි කටයුතු කරන මෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

මේ සම්බන්ධයෙන් අපි සියළුදෙනාම එකතු වෙලා මේ අහිංසක මිනිසුන් වෙනුවෙන් වැඩ කරමු කියලා මම කියනවා. මන්ත්‍රිවරු සියළු දෛනාටම මේ සම්බන්ධව ස්තූතිවන්ත වෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

ප්‍රජා ශාලාවට අසල නිවසේ ඉන්න පුද්ගලයා මෙම ප්‍රජා ශාලාවේ වහල ගැසිමට අවශ්‍ය ශ්‍රමදායකත්වය ලබාදීමට පෙරොන්දු වෙනවා. ඒ බව ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙම කාලොචිත යෝජනාවක් එබැවින් ඉදිරියේදී මේ සම්බන්ධයෙන් කටයුතු කිරිමට බලාපොරොත්තු වෙන බව ප්‍රකාශ කර සිටිනවා.

**තීරණය - ඊ-09.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ.10 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.10.1 මතුගම ප්‍රාදේශීය සභාව යටතේ පාලනය වන විදි ලාම්පු මා නියෝජනය කරනා මීගම ආදාවල කොට්ඨාසයේ අක්‍රියව ඇති බැවින් විදි ලාම්පු නැවතත් අලුත්වැඩියා කොට සවි කිරිම සඳහා ගරු සභාවට යෝජනා කරමි. ( මීගම, ලද්දුව, කඹුරුගොඩ. ආදාවල, පොල්දුව)

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී. සනත් සංජීව මහතා**

මේ විදි ලාම්පු අළුතින් දාන්න නෙමෙයි මම යෝජනා කරන්නේ. මේ විදි ලාම්පු වැඩ කරනවා ඒවා පිච්චිලා නැහැ ඒ නිසා පොඩ්ඩක් බලන්න.

**ගරු ප්‍රාදේශිය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මීගම, ලද්දුව,කඹුරුගොඩ කොට්ඨාස වල අද ලයිට් හදන්න ත්‍රිවිල් එක යවලා තියෙන්නේ අද ඔබතුමාට හෙට දිනය වන විට යම්තාක් දුරට හදලා තියෙවි.

**තීරණය - ඊ.10.1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ-10.2 775 මිගම ග්‍රාම සේවා වසමේ මිගම තොටුපල පාර පී.කේ. සමන්ත මහතාගේ නිවස අසල (බෝක්කුව) පටු බැවින් එම ස්ථානය පුළුල් කොට අලුත්වැඩියා කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ-10.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ-10.3 776 ආදවල ග්‍රාම සේවා වසමේ ගම්මැදි පාර දීපිකා මහත්මියගේ නිවස අසල (බෝක්කුව) කැඩි ඇති බැවින් එය නැවත අලුත්වැඩියා කර දෙන ලෙස ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ-10.3 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ-10.4 776 ආදවල ග්‍රාම සේවා වසමේ පන්සල පාර කැඩි ඇති බැවින් එම මාර්ගය නැවත අලුත්වැඩියා කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා**

අංක ලබාදුන්නද වැඩේ කෙරෙන්නේ හරියට ඒ ගැන හොයලා බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පිරිස් මහතා**

සභාපතිතුමා මම ලිපියක් ලබා දුන්නා ලයිට් හදන්න තවම ඒ සම්බන්ධයෙන් කටයුත්තක් සිදු වෙලා නෑ ඒ ගැන දැනගන්න පුළුවන්ද

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මේ වන විට අපි කොට්ඨාසයෙන් කොට්ඨාසයේ විදී පහන් අළුත්වැඩියා කරමින් යනවා දැන් ගොඩක් දුරට හදමින් යනවා තව ටිකයි තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ.ඩී. තිළිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය**

මම මීට පෙර යටදොලවත්ත කහමුල්ල පාරේ ලයිට් වගයක් හදන්න කියලා ඉල්ලීමක් කරා තවම ඒ සම්බන්ධයෙන් කටයුතු කරලා නැහැ.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

කහමුල්ල පාරේ කොටසක් කරලා ඉවර කරලා තියෙනවා. ඉදිරියේදී ඒ ටික හදනවා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අබ්දුල් හමීඩ් මොහොමඩ් රම්සාන් මහතා**

මගේ කොට්ඨාසයේ ලයිට් ටිකත් හදලා දෙන්න කියලා කියා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ දොන් චන්ද්‍රදාස මහතා**

පුද්ගලික හේතුවක් නිසා එම ගෙදර අය ලයිට් එක දාන්න දෙන්නේ නැහැ. එම ස්ථානය හරිම කරුවලයි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

එම ස්ථානයේ ඇති ස්විච් එක එහා කණුවට සවි කරලා දෙන්නම්

**තීරණය - ර්-10.4 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

## 11 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා

11.1 මතුගම ප්‍රාදේශීය සභාවේ 2018 වර්ෂයේ පත්වූ ප්‍රාදේශීය සභාව විසින් මතුගම ප්‍රාදේශීය සභාවෙන් පාලනය වන නාගරික රථවාහන නැවතුම් පලක් ඉදිකිරීම සඳහා මතුගම නෑබඩ පාරේ සුදර්ශනාරාම විහාරස්ථානයට යාබදව ඇති භූමිය වන අළුබෝගහ අස්වැද්දුම, කොස්වත්තගොඩ ලන්ද කැටකැරැල්ල ගහ ලන්ද සහ අළුබෝගහ දෙණිය යන ඉඩම් කොටස් පවා ගෙන රථවාහන නැවතුම් ස්ථානයක් ඉදිකිරීමට යෝජනා සම්මත කරන ලදී.

අනතුරුව එම ඉඩම් තුළින් විහාරස්ථානය භූමිය හැර අක්කර 05ක පමණ අත්හැර දැමූ කුඹුරු කොටස හඳුනා ගන්නා ලදී. මෙම ඉඩම් කොටස් ඉඩම් හිමි අයිතිකරුවන් සමඟ කරන ලද සාකච්ඡා වාර කීපයකින් පසු ප්‍රාදේශීය සභාව

ඉදිරිපත් කළ ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩමෙන් 2/3ක කොටසක් නොමිලයේ පරිත්‍යාගයක් ලෙස ලබා දිමෙන් ඉතිරි 1/3 ක බිම් කොටස එම අයිතිකරුවන් වෙත අයිතිය තබා ගැනිමටත් එකගතාව ඇති කරගන්නා ලදී. එම 1/3ක කොටස ප්‍රාදේශීය සභාව මගින් සංවර්ධනය කොට පස් පුරවා දන ලෙස කරන ලද ඉල්ලිම ප්‍රාදේශීය සභාව පිළිගන්නා ලදී.

අනතුරුව මෙම ඉඩමේ නොමිලේ පවරාගත් කොටස් සහ මිලදී ගන්නා ලද සුළු කොටසක් ඇතුලත්ව ගිවිසුම් පරිදි සංවර්ධනය කිරිම සඳහා ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා ඉඩම් සංවර්ධනය කිරිමේ සංස්ථාවේ නිර්දේශ සහ අනුමැතිය ලබාගෙන ප්‍රාදේශීය සභාව විසින් ඉඩම සංවර්ධනය කිරිමට ආරම්භ කරන ලදී.

වැසි ජලය ගලා බසින ඇළ මාර්ග සංවර්ධනය හා බෝක්කු ඉදිකර ඉදිරි කටයුතු ආරම්භ කළද 2023 වර්ෂයේ පළාත් පාලන මැතිවරණය පැවැත්විම සඳහා 2023.03.19 දින ප්‍රාදේශීය සභාව විසුරුවා හැරිම සිදුවිය.

එයින් අනතුරුව මෙම භූමිය සංවර්ධනය කිරිම අත්හිටුවා ඇත. මේ වන විට මෙම භූමිය අක්‍රමවත් ලෙස කැළි කසල ගොඩ ගසන ස්ථායක් බවට පත් වී ඇත.

මතුගම ප්‍රාදේශීය සභාවේ අත්‍යවශ්‍ය ව්‍යාපෘතියක් ලෙස හා මතුගම ප්‍රාදේශීය සභාවට ආදායම් උපදවන ව්‍යාපෘතියක් වන මෙම ප්‍රාදේශීය සභාවට ආදයම් උපදවන ව්‍යාපෘතියක් වන මෙම නාගරික රථවාහන නැවතුම් ස්ථානය ඉදිකිරිම් කටයුතු යලි ආරම්භ කිරිමට කටයුතු කළයුතු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**මා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාව මීට පෙර ඔබතුමාගේ යෝජනාවකින් ඉදිරිපත් වුණා එම නිසා මාගේ මේ යෝජනාව මා විසින් ඉල්ලා අස්කර ගන්නා බව ගරු සභාවට ප්‍රකාශ කර සිටිනවා.**

**ඊ.12 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.12-1 793 බී උතුර ග්‍රාම නිලධාරි වසමේ සෆ්න් මහතාගේ කඩය ඉදිරිපිට මාර්ගය සංවර්ධනය කරන ලෙසට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මාවතගේ ගාමිණි සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.එච්.එම්. රම්සාන් මහතා**

මෙම මාර්ගය ඉතා අබලන් තත්ත්වයේ ඇති බැවින් එය සංවර්ධනය කර දෙන මෙන් ඉල්ලා සිටිනවා

**තීරණය - ඊ.12-1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.12.2 793 බී නැගෙනහිර, 793 ඒ දකුණ සහා පාරවල් වල මායිම් ලකුණු කරන ලෙසට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී මාවගේ ගාමිණී සිසිර කුමාර මහතා විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.12.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ.13 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී රුවන්ති වාසනා රත්නායක මහත්මිය විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.13.1 802 බී යටදොල බටහිර ග්‍රාමසේවා වසමේ මීගහයට සිට කොස්ගහකන්ද පෙදෙසට තිබෙන මාර්ගය ප්‍රතිසංස්කරණය කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.13.1 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.13.2 එම කොට්ඨාසයේම කලෙලමගල් ජාතික පාසල ඉදිරියෙන් තිබෙන සෙන්ජෝජ් වතුයායේ පළමු හා දෙවන ලැයිම් කාමර සඳහා යාමට ඇති මාර්ගය පිළිසකර කිරිමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි කේ.ඒ.ඩී. තිළිණි මධුෂාණි සිරිවර්ධන මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

වත්තක පාරක හදන්න අපිට අවසරයක් තියෙනවාද කියලා අපි හොයලා බලන්න ඕන. වත්තේ ලැයිම් කාමර වලට යන පාර පිලිසකර කිරිමට අපි වියදම් කරන්න ඕනද කියලා හොයලා බලන්න මම කියනවා. නැත්නම් අපිට වත්තෙන් ප්‍රතිපාදන ලබාදෙනවාද යන්න සොයලා බලන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

වත්තට යන මාර්ගය කොන්ක්‍රිට් කරලා ඉවරයි. ගිය පාර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා කරලා තියෙන්නේ ඇතුල් වන තැන තියෙන ප්‍රධාන මාර්ගයේ ටික විතරයි අපිට කරන්න තියෙන්නේ.

**තීරණය - ඊ.13.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.13.3 ඉහත කී කොට්ඨාසයේ ඇති සුසාන භූමියේ තිබෙන අවසන් ගෞරවය දැක්වීම සඳහා මිනි තබන කුටිය ගරා වැටී ඇති හෙයින් එය භාවිතයට සුදුසු පරිදි පිළිසකර කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චන්දිමා රුවිනි ප්‍රියංගිකා හෙට්ටිආරච්චි මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.13.3 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

**ඊ.14 ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය එරංග කරවිට මහතා විසින් යථා පරිදි කල් දී ඇති යෝජනා**

ඊ.14.1 මතුගම ප්‍රාදේශීය සභා වලගෙදර උප කාර්යාලයේ කේන්ද්‍රීය කෙට වොලිබෝල් පුහුණු සංචිතයක් ආරම්භ කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය එරංග කරවිට මහතා**

ජාත්‍යන්තර මට්ටමේ පුහුණුකරුවෙකු මේ සම්බන්ධයෙන් ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙන්න බලාපොරොත්තුවෙන් ඉන්නවා.

**තීරණය - ඊ.14.1යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.14.2 මතුගම නගරය හා මතුගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි සංවර්ධන සැලසුම් උපදේශක කමිටුවක් පිහිටිවීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**තීරණය - ඊ.14.2 යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.**

ඊ.14.3 වලගෙදර මහා විද්‍යාලයේ හා වලගෙදර පිරිනිවාස ප්‍රාථමික විදුහල මාර්ග දෙපසින් පාසල දැනුවත් කිරීමේ පුවරු හා වේග සීමා සළකුණු ස්ථාපිත කිරීමට ගරු සභාවට යෝජනා කරමි.

**එම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය විසින් ස්ථිර කරන ලදී.**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සංජය එරංග කරවිට මහතා**

අළුත්ගම මතුගම ප්‍රදාන මාර්ගය හා සිරිනිවාස ප්‍රාථමිකය අසල මාර්ග සඳහා වේග සිමා ලකුණු කිරීම අත්‍යවශ්‍ය බැවින් ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු සලසා දෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

වලගෙදර සංචිතයක් ඇති කිරීම සම්බන්ධව මම ලේකම්තුමියගෙන් ඇහුවා වොලිබෝල් සංචිතයට අපේ කාර්යය මණ්ඩලය ඇතුලත් කරන්න කැමතිද කියලා එතුමිය කැමතියි. මන්ත්‍රීතුමියන්ලාගෙන් ඇහුවා එතුමියන්ලාත් කැමතියි. සංජය කරවිට මන්ත්‍රීතුමාත් කැමතියි. සංජය කරවිට මන්ත්‍රීතුමාගේ උපදේශකත්වයෙන් මෙය පැවැත්වීමට කටයුතු කරමු.

මෙම මන්ත්‍රීතුමාගේ තුන්වන යෝජනාවත් ඉතා වැදගත් යෝජනාවක් මේ සම්බන්ධව අවධානය යොමු කරන මෙන් මා මේ අවස්තාවේ ප්‍රකාශ කර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජගත් විමලසිරි මහතා**

මේ අවස්ථාවේ දී කතා කලා සුසාන භූමි මාර්ග සංවර්ධනය හා ඉඩම් සම්බන්ධව මේ සම්බන්ධයෙන් අපේ ප්‍රදේශ වලද මෙවැනි ගැටළු පවතිනවා එම නිසා මම සභාපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා අපක්ෂපාතිව හා මධ්‍යස්ථව අපේ කොට්ඨාස ගැනත් අවධානය යොමු කරන ලෙස.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

තඹරුටිය ප්‍රජා ශාලාවේ වොලිබෝල් ක්‍රිඩාංගනයක් හඳලා තියෙනවා. ඒක දැන් වල් වැදිලා එය නැවත ශුද්ධ කර පිළිසකර කර ජනතා අයිතියට ලබා දෙන ලෙස ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ජී. ලාල් රංජිත් සිල්වා මහතා**

කරවිට මන්ත්‍රිතුමාගේ ඉදිරිපත් කරන ලද යෝජනාව සම්බන්ධයෙන් මම විශේෂ ස්තූතිය ප්‍රකාශ කර සිටිනවා.

**තීරණය - ඊ.14.3 යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.**

(උ) කාරක සභා වාර්තා පිළිබඳ සමාලෝචනය කිරීම - අමුණා ඇත

- 2025.07.30 වන දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව හා 2025.07.30 වන දින ප්‍රසම්පාදන කාරක සභා වාර්තාව (ඇමුණුම 3)

(ඌ) සභාවේ ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය කිරීම -නැත-

(ඒ) න්‍යාප පත්‍රයට ඇතුලත් විය යුතු කරුණු

- සභික අදහස් දැක්වීම

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පූජ්‍ය නාරවිල සමිතවංශ හිමි**

ගරු සභාපතිතුමනි, පුද්ගල පැහැදිලි කිරීම් යටතේ කාරණා කිහිපයක් කතා කළා එහිදි මම අදහසක් දැක්වුවා කටුගහහේන රෝහල සම්බන්ධව ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රිවරු හැටියට අපිට කතා කරන්න පුළුවන් තැන මෙතන අපිට වෙන තැනක් නැහැ කතා කරන්න අපි මෙතන කතා කරලා ගියාට පස්සේ ඒ පුටු ටික ආයෙමත් රෝහලට ගෙවිත් තියෙනවා. අපි මේ සභාවේ කතා කරපු එකේ ප්‍රතිඵලයක් නොමෙයිද මේක. මම සතුටු වෙනවා මේ සම්බන්ධව මෙතන කතා කරපු නිසා මේ ඒ අවශ්‍ය දේ නැවතත් රෝහලට ලැබිලා තියෙනවා.

පසුගිය සභා වාරයේදි මගේ පුද්ගලික මන්ත්‍රි පැහැදිලි කිරීම් යටතේ අදහස් කිහිපයක් ඉදිරිපත් කලා. පසුගිය කාලයේ මේ සභාවේ ව්‍යාපෘති සිදුවුනේ කොහොමද, අනුමැතිය ලබා ගත්තේ කොහොමද කියලා යොහලා බලන එක අළුතින් භාර ගත්ත සභාපතිවරයා වන ඔබතුමාටත් අපිටත්

වගකීමක් තියෙනවා. අපි ජේ.සී.බී. එක ගැන කතා කරානේ දැන් ඒකට මොනවා හරි වෙලා අවොත් ලලිත් මන්ත්‍රීතුමත් මමත් ගෙවන්න ඕන. අධිභාරයක් අවොත් හිටපු අපි 33දෙනාම ගෙවන්න ඕන. මේවා නිවැරදි කරලා අපි භාරගත යුතු වෙනවා.

යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න යටතේ මම ප්‍රශ්න ඉදිරිපත් කලා මේ ටික අධ්‍යනය කරලා බලන්න මේ දිලා තියෙන සමහර උත්තර සම්බන්ධව සෑහිමකට පත්වෙන්න බැහැ. දෙමහල් වැසිකිලිය ඉදිරිකිරිමට ලක්ෂසියයක් මෙකෙන් ප්‍රතිලාභ ලැබෙන්නේ කාටද කියලා ඇහුවාම කියනවා පිට්ටනියේ සෙල්ලම් කරන්න එන ළමුන්ටයි. මතුගම නගරයට එන මිනිසුන්ට යන්න වැසිකිලියක් නැහැ. මේ සියළුම ඒවාට ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුව මත කියලා තියෙනවා ඒ කමිටුව මොකක්ද දැනගන්න, මේ වාහන අංගනය යෝජනාවක් දාලා තිබ්බාලු ඒ යෝජනාව 2024 තමයි ක්‍රියාත්මක වෙලා තියෙන්නේ. මම දැනුවත්ව මේ සභාවේ වාහන 26ක් තියෙනවා. සභාපතිතුමා මම වැරදි නම් නිවැරදි කරන්න වාහන අංගනයේ දැමිය හැක්කේ හතරයි මේවා අපි නිලධාරින්ගෙන් නෙමෙයිද මේ ගැන අහන්නෙ. අපිට කිසිම නිලධාරියෙක් එක්ක පෞද්ගලික අමනාපකම් නැහැ. අපිට තියෙන ගැටළු සම්බන්ධව සභාපතිතුමාට ඉදිරිපත් කරනවා ඒ සම්බධයෙන් සභාපතිතුමා අදාල නිලදාරියා අපිට ඒ ප්‍රශ්න විසදලා දෙන්න. අපි සුහදව මේ වැඩ ටික කරගෙන යමු. අටේ පැයට අත්සන් කරලා සේවයට වාර්තා නොකර වැඩිපුර රු. 80000.00 වැටුප් අරගෙන දැනට ආපසු ගෙවන්න සිද්ද වෙච්ච නිලධාරින්ට, මෙය වැරදිනම් නිවැරදි කරන්න. සහපතිතුමා මේ තොරතුරු සම්බන්ධව නිවැරදි කර ගන්න. යනවා නම් සාධාරණය මේ ගමන ඒකමතිකව යමු. මේ ගැටළු සමඟ හැමදාම හැප්පෙන්න වුවද සුදානම්.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චමිලානි රුවන්දිකා ත්‍රිමාන්න මහත්මිය**

2025.06.28 වන දින මතුගම පොලිසියෙන් කතා කරලා කිව්වා කටඋත්තරයක් ගන්න පොලිසියට එන්න කියලා. හේතුව ඇහුවාම කිව්වේ මතුගම සභාවෙ ලේකම් තුමිය පැමිණිල්ලක් දාලා තියෙනවා කියලා. ලේකම්තුමියට විරුද්ධව සභාවේ සේවකයෙන් පෙත්සමක් ගහලා තියෙනවා කියලා. එම පෙත්සම තැපැත් කරලා තියෙන්නේ දොඩන්ගොඩ තැපැල් කාර්යාලයෙන්යෙන්. ඒ එක සේවකයෙකුගේ දූරකථනයක ඒ ලියුම් තැපැල් කරපු වෙලාවේම මට සහ ඒ වන මන්ත්‍රීව සිටි කසුන් මුණසිංහ මහතාට දූරකථන ඇමතුමක් ලබා ගත්බව සටහන් වෙලා තිබ්ම නිසා අපව කැඳවලා තියෙන්නේ. තවම මේ පැමිණිල්ල විභාග වෙනවා මේ සම්බන්ධව සොයා බලා ඒ පැමිණිල්ල ඉල්ලා අස්කරගන්න කියන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මන්ත්‍රීතුමිය මේ චෝදනාව ලේකම්තුමිය ප්‍රතික්ෂේප කරනවා. ඒ නිසා මේ චෝදනාව දිගින් දිගටම එතුමියට කරන්න බැහැ. මේ සම්බන්ධයෙන් පොලිසිය කතා කරා මම කිව්වා මේ චෝදනාව උසාවි දාලා සිතාසියක් එවන්න එතකොට මම උසාවියට ඇවිල්ලා ඒකට කරුණු ඉදිරිපත් කරන්නම් කියලා. ලේකම් තුමිය පැමිණිල්ල දාලා තියෙන්නේ ලේකම්තුමියගේ අත්සන අවභාවිත

කිරිම සම්බන්ධයෙන්. ඔබතුමිය පොලිසියට ගිහිල්ලා විමර්ශනයක් ඉල්ලන්න කවුද මේ පැමිණිල්ල දැම්මේ කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලලිත් ඉන්දික සිරිවර්ධන මහතා**

රුවන්දි මන්ත්‍රිතුමිය විමර්ශන සඳහා වෙනත් අයවත් කැඳවනවා. මම හිතන්නේ මේ එවැනි අවස්ථාවක්. අපේ හාමුදුරුවෝ ඉදිරිපත් කරපු කතන්දරය වැරදි නැහැ. හාමුදුරුවෝ ඉදිරිපත් කරන ලද ප්‍රශ්න සම්බන්ධයෙන් ලැබුනු පිළිතුරු සම්බන්ධයෙන් හාමුදුරුවෝ දරණ ස්ථාවරය සම්බන්ධයෙන් මමත් එකඟයි. සභාපතිතුමනි මට තියෙනවා ඔබතුමාගෙන් අවධානය යොමුකරන්න කාරණා දෙකක් එකක් තමයි මතුගම ප්‍රාදේශිය සභාව රැස්කරන දිනය තමයි ජුනි මස 30 වන දින පළාත් පාලන කොමසාරිස්තුමියගේ අත්සනින් ලියුම් එවලා සභාපතිවරයා තෝරගන්න දවස හැටියට නම් කරලා පළමු මංගල රැස්වීම තිබ්බේ ජුනි 30 දැන් එදාට මේ මන්ත්‍රීවරුන්ට වැටුප් ලැබෙන්නේ නැද්ද. මන්ත්‍රී දිමනාව ලැබෙන්නේ නැද්ද, ලබන්න හිමිකමක් නැද්ද මේ මන්ත්‍රිවරුන්ට හිමිකමක් තියෙනවා නේද ඒ වැටුප ලබන්න. අදත් මේ ලියම් කවරය බැලුවේ ඒක තියෙනවද කියලා අදත් ඒක නැහැ.

මේ වන විට යටදොලවත්ත උප කාර්යාලයේ වහල සුළඟට ගසාගෙන ගිහින් තියෙනවා. ඒක මුළුමනින්ම ගැලවෙලා ගිහින් තියෙනවා එම වහල නැවත ප්‍රතිසංස්කරණය කරන්න සභාවේන් තාවකාලිකව පියවරක් ගැනිමට සුදානමක් නැද්ද කියලා ඔබතුමාගෙන් යොමුකර සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

දිමනාව පිළිබඳව මමත් විමසිම් කලා දැන් ඒ පිළිබඳව පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත උපදෙස් සඳහා යොමුකරලා තියෙනවා. ශරිර සුවතා මධ්‍යස්ථානයේ වහල සම්බන්ධයෙන් NBRO වාර්තාවක් ගන්න කියලා තියෙනවා. එම වාර්තාව එනකන් ඒ පිළිබඳ ඉදිකිරිමක් කරන්න විදිහක් නැහැ. මැෂින් ටික ආරක්ෂිතව තබලා තියෙන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වයි. සගීත් මධුසංඛ පීරිස් මහතා**

නවුත්තුඩුව බටකැටිය මුල්ල මාතෘ ළමා සායනය සම්බන්ධව මම යෝජනා කලේ පාර කාපට් කිරිම සම්බන්ධව නමුත් ඔබතුමා කියනවා ප්‍රාදේශීය සම්බන්ධිකරණ කමිටුවේදි සංජිව රණසිංහ මන්ත්‍රීතුමා මේ පාර හදලා දෙනවා කියලා. නමුත් මේ සම්බන්ධිකරණ වාර්තාවේ කොහේවත් සටහන් වෙලා නැහැ මේ පාර හදනවා කියලා. මම කැමතියි දැනගන්න ඔබතුමා මේ සම්බන්ධව දැනුවත්ද කියලා.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

සම්බන්ධීකරණ කමිටුවේදී මෙය මෙතන තැබිය යුතුයි කියලා තමයි මම කතා කලේ ඒ අවස්ථාවේදී තමයි සංජිව රණසිංහ මන්ත්‍රීතුමා කිව්වේ මේ පාර අපි හදලා දෙන්නම් කියලා. ඒ යෝජනාව ඇරෙන්න මම මේ හිතලා කියනවා නෙමෙයි. වෙනත් පාර්ශවයක් මේ සම්බන්දයෙන් විරුද්ධව කතා කරද්දි මම පක්ෂව තමයි මම මගේ උත්තරය දුන්නේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එස්.ආර්. දුමිඳු චතුර සම්පත් මහතා**

කැළණිය කැම්පස් එකේ ලමුන් වගයක් ඇවිල්ලා ප්‍රශ්න කර ඒකට මැදිහත් වුනේ මමයි නිහාල් මන්ත්‍රීතුමයි. බටමුල්ල කන්ද පන්සලට යන තැන විදේශිකයින් පවා එන තැනක් මෙතනට අශෝබන විදිහට පන්ති යන ළමුන් හැසිරෙනවා කියලා . මම අහන්නේ ඔබතුමාගෙන් පොලිසිය දැනුවත් කරලා මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගන්න බැරිද කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තොටගමගේ නිහාල් මහතා**

සභාපතිතුමනි ඔබතුමාගේ ලස්සන මතුගමක් කියන සංකල්පයට අපි සහයෝගය දෙනවා. හැමතැනම උපකාරක පන්තිවල බෝඩ් සවි කරලා තියෙනවා. ඒක ඇස් වලට හරිම අවහිරයක්. පෙනුවට අවහිරයක්. මම දැනගන්න කැමතියි. මේ බෝඩ සවිකරන්න කුමන හෝ කමිටුවකින් අවසරයක් තියෙනවාද, එහෙම අනුමත කරන කමිටුව කුමක්ද, කමිටුවකින් අවසර අරගෙනද මේ බෝඩ් සවිකරන්නේ කියලා මම දැනගන්න කැමතියි. කවුද මේ බෝඩ් සවිකරන්න අවසර දෙන නිලධාරියා කවුද කියලා දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මන්ත්‍රීතුමා අපි කිසිම තැනක අවසරය දීලා නැහැ. සභාව දැනුවත් කරලා තියෙන්නෙ නගර සිමාව ඇතුලේ සියළුම බෝඩ් සඳහා දෙසැම්බර් 31 දක්වා මුදල් ගෙවලා තියෙනවා. ඒ මුදල් ගෙවපු බෝඩ් දැන් ඉවත් කරන්න බැහැ. ඉදිරිකාල සිමාව තුළ බෝඩ් ගසන්න කලින් අපෙන් අවසර ගන්න ඕන දැන් ගහලා තියෙන බෝඩ් සම්බන්ධයෙන් මට වගකියන්න බැහැ. මුදල් නොගෙවන ලද බෝඩ් දැනටත් කිහිපයක් ගලවලා ගෙනල්ල දාලා තියෙනවා. අනවසර බෝඩ් ගලවලා ඉවත් කරන්න කියන තැන තමයි මම තදින්ම ඉන්නෙ. RDA, PRD එක දැනුවත් කරලා තියෙන්නේ කිසිම බෝඩ් එකක් අපව දැනුවත් නොකර ගහන්න එපා කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කළුගල හේවාගේ ගාමිණි මහතා**

හොරවල උප කාර්යාලය තියෙන්නේ යටදොලවත්තේ මම ඉල්ලීමක් කරනවා තාවකාලික නිලදාරින් කිහිපදෙනෙක් මතුගම සභාවේ පත් කරලා එහි සේවය ලබාදීමට කටයුතු කරන ලෙසට. ඉදිරියේ දී බලමු හොරල උප කාර්යාලය හොරවල ප්‍රදේශයට ගෙනියන්න.

**ගරු ප්‍රාදේශීය සභා සභාපති කසුන් මුණසිංහ මහතා**

මෙය ටිකක් ලොකු කාරණයක් ඒ නිසා අපි බලමු ඉදිරියේ දී මේ පිලිබඳව සාකච්චා මට්ටමට ගිහින් තිරණයක් ගන්න පුළුවන්ද කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මෙරිල් මුණසිංහ මහතා**

MOH එකේ ඩොක්ටර් තීරණයක් දුන්නා සායනය කීරන්තිඩියට ගෙනියන්නේ නැහැ කියලා. මමත් ඉන්නේ මේ සායනය තියෙන්න ඕන කිය තැන. ලේකම්තුමියගේ අත්සන අවභාවිත කිරිම සම්බන්ධයෙන් ඉහළින් ලබාදුන් උපදෙස් අනුව එතුමිය පොලිසියේ පැමිණිල්ලක් දාලා තියෙනවා ඒ සම්බන්ධයෙන් මමත් කටඋත්තර දෙන්න පොලිසියට ගියා. සභාවේ කටයුතු කරගෙන යාමට වැඩි කාල සීමාවක් යනවා එම නිසා කාල සිමාව පාලනය කරගමු.

**න්‍යාය පත්‍රානුකූලව මෙදින නියමිත කටයුතු අවසන් විමෙන් පසුව මහ සභාවේ කටයුතු ප.ව. 3.30ට පමණ අවසන් විය.**

කසුන් මුණසිංහ.

සභාපති,

මතුගම ප්‍රාදේශීය සභාව.